# බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව
# මහා සභා රැස්වීමේ වාර්තාව.
# 2021.06.16

වර්ෂ 2021 ක් වූ ජුනි මස 16 වන බදාදා දින පෙ.ව. 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වූ ජුනි මස මහා සභා රැස්වීමේ වාර්තාවයි.

**සහභාගීත්වය.**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
04. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
05. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
06. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
07. ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා
08. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
09. ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
10. ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය
11. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
12. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
13. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
14. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා
15. ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා
16. ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
17. ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
18. ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය
19. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
20. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා
21. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

මීට අමතරව ප්‍රාදේශීය සභාවේ ලේකම් එල්.එච්. අනිල් රංජන් මහතා ද සහභාගී විය.

**<u>ආගම සිහි කිරීම හා සභාව පිළිගැනීම.</u>**

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සියළුම ගරු සභිකවරුන්, ලේකම්තුමා ප්‍රධාන නිලධාරීන් හා මාධ්‍යවේදීන් පිළිගැනීමෙන් අනතුරුව පළමුව ආගම සිහිපත් කරන ලදී. ඉන් අනතුරුව විනාඩියක නිශ්ශබ්දතාවය රැකීමෙන් රට වෙනුවෙන් සටන් වැද මියගිය රණවිරුවන් හා මියගිය සභිකවරුන්, නිලධාරීන් හා සේවකයන් සිහිපත් කරන ලදී.

(ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා, ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**<u>(අ) පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම ඃ- නැත</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2021-05-19 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව ඊළඟ මහා සභා රැස්වීමේදී මේ මහා සභා රැස්වීමේ වාර්තාවත් එක්ක ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා.

**<u>(ආ) සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අද මහා සභා රැස්වීම පැය භාගයකට පමණ සීමා කරන්න කියලා පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් දැනුම් දීලා තියෙනවා.

ඇත්තටම මාසයකට සැරයක් සභාව තියන්න අවශ්‍යම නිසා තමයි අද මහා සභා රැස්වීම තියන්නේ. ඔබතුමන්ලා දන්නවා ගිය මාසයේ 19 වෙනිදා මහා සභා රැස්වීම තිබුණේ, නමුත් ඊට පස්සේ 21 වෙනිදා ඉඳන් සංචරණ සීමා දාලා තිබුණේ. ඉතිං ඒක හින්දා ගිය සභාවේ ගනිපු තීන්දුවත් අපිට ක්‍රියාත්මක කර ගන්න බැරි පරිසරයක තමයි මේ මහා සභා රැස්වීම පැවැත්වෙන්නේ. ඉතිං ඒක හින්දා න්‍යායපත්‍රානුකූලව ඉක්මනින්ම රැස්වීමේ වැඩ කටයුතු කරගෙන යන්න බලාපොරොත්තු වෙනවා. ගැටළු තියෙනවා නම් අවසානයේදී යම් අවස්ථාවක් දෙන්නම්. බාධාකිරීම් වලින් තොරව කරුණාකරලා රැස්වීමේ මූලික කටයුතු ටික අවසන් කරන්න අවස්ථාව ලබා දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා.

මම කණගාටුවට පත් වෙන දෙයක් තියෙනවා. මම විතරක් නෙමෙයි සියළු මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා ඒක දන්නවා. හුසේන් කියාස් මන්ත්‍රීතුමාව මන්ත්‍රීධූරයෙන් නෙරපලා ගැසට් පත්‍රයක් මුද්‍රණය කරලා තියෙනවා පසුගිය 14 වෙනිදා. පක්ෂයේ ඉල්ලීම මත මැතිවරණ කොමසාරිස් විසින් කියාස් මන්ත්‍රීතුමාගේ මන්ත්‍රීධූරය අහෝසි කරලා තියෙනවා. ඉතිං ඒ පිළිබඳව ඇත්තටම සභාපතිවරයා විදියට මගේ කණගාටුවත් මේ එක්කම ප්‍රකාශ කරනවා. මොකද එතුමා පමණයි කොට්ඨාශයක් දිනපු මන්ත්‍රීවරයෙක් විදියට විපක්ෂයෙන් තේරී පත්වෙලා ආවේ. ඉතිං ඒක තුළ විශේෂයෙන්ම මුස්ලිම් ජනතාව නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් තමයි මේ. ඉතිං ඇත්තටම ප්‍රාදේශීය සභාවේ වැඩකටයුතු වලට, විශේෂයෙන්ම ඒ ප්‍රදේශයේ වැඩකටයුතු වලට ඒක ලොකු බාධාවක්. අපි කවුරුත් දන්නවා කියාස් මන්ත්‍රීතුමා තමන්ගේ ජනතාව වෙනුවෙන් විශාල සේවයක් කරා. අඩුපාඩු නැත්තේ නැහැ. නමුත් ඒ ජනතාව වෙනුවෙන් සෑහෙන්න සේවයක් කරන මන්ත්‍රීවරයෙක්. ඉතිං ඒක තුළ ඇත්තටම සභාපතිවරයා විදියට මම මේ ප්‍රකාශය කරත්, කණගාටුවට පත් වෙනවා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** සභාපතිතුමා ඒකට හේතුව මොකක්ද දන්නේ නැද්ද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හේතුව තමයි ඔහු පක්ෂය හැරයාම කියන එක. ඒක පක්ෂය ගනිපු තීරණයක්. ඒක අපි දන්නේ නැහැ. අපිට තියෙන තොරතුරු අනුව පක්ෂය හැර යාම තමයි තියෙන්නේ. ඒක සඳහන් වෙනවා ගැසට් එකේ.

"බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ සභිකයෙකු වන මොහොමඩ් නයිම් හුසෙයින් කියාස් මහතා එක්සත් ජාතික පක්ෂයෙහි සාමාජිකයෙකුව සිටීම අවසන් කර ඇති නිසා එම සභාවේ ඔහුගේ සභික ධූරය ඔහු විසින් අතහැර ඇති බව බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ තේරීම් භාර නිලධාරී කන්ද උඩ චන්ද්‍රලාල් වන මම (262 වැනි අධිකාරිය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ 10අ(1)(අ) වැනි වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි."

එහෙම කියලා තමයි ගැසට් පත්‍රය නිකුත් වෙලා තියෙන්නේ. ඒ පිළිබඳව අදහස් තියෙනවා නම් ඒවා ඉදිරියේදී දක්වමු.

ඒ වගේම මගේ ඉල්ලීම අනුව අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් මන්ත්‍රීවරු ඇතුළු සියළුම නිලධාරීන්ට සහ සේවකයන්ට, එක්කෙනෙකුට කහ පැළ පහ ගාණේ ගෙනල්ලා තියෙනවා. ඒක ලබා නොගත්ත මන්ත්‍රීවරු මහා සභා රැස්වීමෙන් පසුව ඒවා ලබා ගන්න. සෑම මන්ත්‍රීවරයෙකුටම, සෑම නිලධාරියෙකුටම, සෑම කම්කරුවෙකුටම, එක් කෙනෙකුට කහ පැළ පහ ගාණේ ඊයේ ගෙනාවා. මන්ත්‍රීවරු ඒක රැගෙන යන්න මහා සභා රැස්වීම අවසානයේදී.

**<u>ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම.</u> ඃ- නැත**

**<u>(ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න</u> ඃ- නැත**

**<u>(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා</u>**

**<u>ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමාගේ යෝජනා</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- 01.** අප ප්‍රාදේශීය සභාව සතු එගොඩකනත්ත ප්‍රජා ශාලාව තුළ 107/ඒ, බෝපෙ උතුර ග්‍රාම නිලධාරි කාර්යාලය පවත්වාගෙන යාමට අනුමැතිය ලබාදීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට ප්‍රාදේශීය ලේකම්තුමියත් ලිපියක් එවලා තිබුණා ඒ අදාළ නිලධාරියාට ඒක ලබා දෙන්න කටයුතු කරන්න කියලා.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**02.** වටරක කළුපහන මාර්ගයේ, චලක ගරාජය ඉදිරිපිට ඇති බෝක්කුව සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ප්‍රධාන කාපට් පාරේ දකුණු පැත්තට වෙන්න සම්පූර්ණයෙන්ම ගිලා බැහැලා තියෙනවා. ඒක හදන්න තමයි මේ යෝජනා කරේ.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමාගේ යෝජනා</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ජේ.ඒ. චන්ද්‍රකුමාර මන්ත්‍රීතුමා තවම මහා සභා රැස්වීමට සහභාගි වෙලා නැති නිසා ඒ යෝජනාව මම ඉදිරිපත් කරන්නම්.

**03.** පැලවත්ත පළමු පටුමග මාර්ගය හරහා කාණුව ඉදිකර එය මත යකඩ දැලක් සවිකිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමාගේ යෝජනා</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ යෝජනා වලින් මම අයින් කරන්නත් හදපු යෝජනා තියෙනවා. ඒ වුණත් මම ඒවා අයින් නොකර තියන්න කිවුවා. ඔබතුමා කරුණාකරලා යෝජනා ටික ඉදිරිපත් කරන්න.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** සුබ උදෑසනක්, ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීතුමන්ලාගෙන් සහ මන්ත්‍රීතුමියන්ලාගෙන් අවසරයි. ඒ වගේම ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයෙනුත් අවසරයි. මගේ යෝජනා හතරක් තියෙනවා ඔබතුමා ඉවත් කරන්න හැදුව යෝජනාව මොකක්ද කියලා මම දැන ගන්න කැමතියි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පළවෙනි යෝජනාව ඇත්තටම ඉවත් කරන්න ලෑස්ති කරලත්, ඉවත් කරේ නැහැ. මොකද රුපියල් පන්දාහේ දීමනාව ලබා දෙන එක කෙරීගෙන යනවා. ඒ වෙන කොට කොටසක් කෙරිලත් තිබුණා.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ- 04.** රජය විසින් මෙම කාලසීමාව තුළ ජනතාව වෙත ලබාදෙන රු.5,000.00ක සහන දීමනාව සංචරණ සීමා හේතුවෙන් ආදායම් මාර්ග අහිමි වූ සියලුම ජනතාවට ලබාදෙන ලෙස ජනාධිපති කාර්ය සාධක බලකායට දන්වා යැවීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ඒක ජනාධිපතිතුමා දෙන්න කිවුවා නේද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක දෙන්න කියලා තීරණය කරලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ඒක හරි. මම කියන්නේ සභාපතිතුමනි, මෙහෙම ප්‍රශ්නයක් එතන තියෙන්නේ. දැන් ඇත්තටම ඒක ලබා දීලා තියෙන්නේ සමෘද්ධිලාභීන්ට විතරයි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ආබාධිත අයටත් ඒක ලබා දුන්නා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ආබාධිත අයටත් දුන්නා. අද ද කොහෙද වැඩිහිටි දීමනාව ලබන අයටත් ඒක ලබා දෙනවා.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** දැන් මෙහෙම කතාවකුත් තියෙනවා. වැඩිහිටි අයට රුපියල් දෙදාහක වගේ දීමනාවක් ලැබෙනවා නම්, ඉතුරු රුපියල් තුන්දාහද දෙන්නේ, නැත්නම් රුපියල් පන්දාහම දෙනවද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතුරු රුපියල් තුන්දාහ දෙන්නේ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** දැන් ඇත්තටම මේ යෝජනාව දැම්මේ මේකයි. දැන් මේ සංචරණ සීමා නිසා ඇත්තටම ජනතාව පොඩි අපහසුතාවයක ඉන්නේ. ඉතිං අපි විශ්වාස කරනවා මේ සංචරණ සීමා පනවපු කාල සීමාව තුළදීම ජනතාවට මේක ලබා දෙන්න පුළුවන් නම් හොඳයි කියලා. මොකද මේ සතියේදී හෝ ලබන සතියේදී සංචරණ සීමා ආණ්ඩුවෙන් ඉවත් කරෝතින් ආපහු ජනතාවට සුපුරුදු රැකියාවලට යන්න පුළුවන්. දැන් ජනතාව පසු කරන්නේ අමාරුම කාලයක්. මේ කාලයේදී තමයි ජනතාවට මේක වටින්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** ඒක මන්ත්‍රීතුමා අපිට විතරක් නෙමෙයි පොදුවේ හැමෝටම අදාළ වෙන කාරණාවක්. මේ දවස්වල ඒ ලැයිස්තු සකස් කෙරෙමින් පවතිනවා. අපි දන්නේ එච්චරයි. ලැයිස්තුවලට ඒක තෝරමින් ඉන්නවා. අපිත් ඒ කමිටුවල ඉන්නවා. ඉතිං ඒක හින්දා දැනට ඒවා තෝරලා භාර දීලා තියෙන්නේ. ගිය සැරේ දීපු සියළුදෙනාටම මේක දෙන්න කියන ඉල්ලීම තමයි තියෙන්නේ. ගිය අවුරුද්දේ අප්‍රේල් වලදී රට ලොක් ඩවුන් කරපු වෙලාවේ දීපු සියළුදෙනාටම මේක නැවත දෙන්න කියලා කිවුවේ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ៖-** ඒ සියළුදෙනාටම ඒ විදියට ලැබෙනවාද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** ඔව්.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ៖-** හරි, බොහොම ස්තුතියි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ៖-** දැන් කහඳූව වත්තෙන් එනකොට සංචරණ සීමා ඇත්තටම ක්‍රියාත්මක වෙනවද කියලා හිතෙනවා. විනාඩි පහලොවක්, විස්සක් යනවා පාරේ ඒ පැත්තෙන් මේ පැත්තට මාරු වෙන්න.

(ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ៖-** ඒක මම ඊයේ ටවුන් එකේදිත් දැක්කා. ඇත්තටම මේ සංචරණ සීමා වලින් වැඩක් නැහැ. මොකද, සංචරණ සීමා කියලා සමහරු ගෙවල්වල හිටියා. හැබැයි අනිත් සියළුදෙනාම හිටියේ පාරේ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ៖-** හැමෝම තමන්ගේ ජීවනෝපාය මාර්ගය කර ගන්නවා.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ៖- 05.** පවතින කොවිඩ් 19 වසංගතය මැඩ පැවැත්වීම වෙනුවෙන් ප්‍රදේශයේ සෞඛ්‍ය මධ්‍යස්ථානයන්හි වෛද්‍ය, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් ඇතුළු කාර්ය මණ්ඩලය සුවිශේෂී කාර්යභාරයක නියැලෙන නමුත් ඉදිරියේදී මෙම ප්‍රදේශවල ඩෙංගු අවධානමට මුහුණපෑමට සිදුවිය හැකි බැවින් සෞඛ්‍ය අංශවලට පවතින මෙම තත්ත්වය තුළ මැදිහත්වීමට ඇති සීමා අවම බැවින් ප්‍රාදේශීය සභාව මගින් විධිමත් වැඩපිළිවෙලක් සකස්කොට බෝපෙ පෝද්දල බල ප්‍රදේශය තුළ ඩෙංගු උවදුර තුරන් කිරීමට කටයුතු කරන මෙන් මෙම ගරු සභාවට යෝජනා කරමි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** මන්ත්‍රීතුමා මෙහෙමයි. අපි දැනටත් කාණු පද්ධති අවහිර වුණ ඒවා පිළිසකර කරලා සුද්ධ පවිත්‍ර කරමින් යනවා. දැන් ඊයෙත් ඩාලින්ටන් වත්ත ප්‍රදේශයේ කාණු පද්ධතියක් අවහිර වෙලා තිබිලා ඒකත් සුද්ධ කරා. ඒ ආකාරයෙන් අපිට කරන්න පුළුවන් දේ අපි කරමින් පවතිනවා.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ៖-** කපුහෙම්පල පාරෙත් තැනින් තැන කුණු දාලා තියෙනවා. මේ ප්‍රශ්නය දිගටම තියෙන ප්‍රශ්නයක්. ගරු සභාපතිතුමා, පහුගිය දවස්වල ඒවා දාලා තිබුණා. ගඳ ගහන නිසා ගමේම මිනිස්සු එකතු වෙලා ඒක වහලා තිබුණා. ඉතිං මෙන්න මේ වගේ දේවල් පොඩ්ඩක් හොයලා බලන්න. ඒ පාරවල් වල කුණු තියෙනවා නම් ප්‍රාදේශීය සභාව මැදිහත් වෙලා ඒක ඉවත් කරලා දෙන්න. ඒක ගැන ප්‍රාදේශීය සභාවට දැන්වූවට පස්සෙත් ඒ කුණු ටික අරගෙන ගිහිල්ලා තිබුණේ නැහැ. ගමේ මිනිස්සු පස් ටිකක් දාලා ඒක වහලා තමයි ගඳ යවා ගෙන තිබුණේ. මේකට මැදිහත්වීමක් කරන්න පුළුවන්නම්.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ៖-** ගරු සභාපතිතුමනි, අනිල් මන්ත්‍රීතුමා මතුකරපු කරුණ සම්බන්ධව මට අදහසක් දක්වන්න තියෙනවා. මොකද, කපුහෙම්පල ගොඩදූව පාරත්, සේනානායක පාරත් සම්බන්ධ වෙන පාර, හේනගෙදර පාර, ආශ්‍රිත ඒ ප්‍රදේශවාසීන්ගේ ඉල්ලීමක් තියෙනවා. ගරු සභාපතිතුමාට ඒ ඉල්ලීම කරා කියලා කිවුවා. මටත් ඒකෙ පිටපතක් ආවා. මම ස්ථානීය පරීක්ෂණයකුත් කරා. ඇත්තටම අනිල් මන්ත්‍රීතුමා කියපු කාරණය සත්‍යයක්. මොකද හේතුව කැලි කසළ, ගෙවල් වල කපපු මුල්, අරවා මේවා ගෙනල්ලා ඔක්කොම ගොඩ ගහලා තියෙනවා. ඇත්තටම ඒ මාර්ගයේ යනකොට ලොකු දුර්ගන්ධයක් හමනවා. ඊළඟට පණුවෝ එහෙමත් ඉන්නවා. ඒ අවට ගෙවල්වලට ඒකෙන් ලොකු අපහසුතාවයක් තියෙනවා. මේකට ඉක්මනින්ම මැදිහත් වෙලා ඒ කටයුත්ත නිවැරදි කරොත් හොඳයි. මම ඉල්ලීමක් කරනවා ගරු සභාපතිතුමනි, කැලි කසළ නොදමන්න කියලා සභාවෙන් නියෝගයක් නිකුත් කරන්න. දැන්වීම් කිහිපයක් අලවන්න ඒ මාර්ගයේ. ඇත්තටම ඒ කට්ටිය හිතුවක්කාරි විදියට තමයි ඒ කටයුත්ත කරන්නේ. අවට ගෙවල්වල අයව බය වද්දාගෙන තමයි ඒ අය ඉන්නවා කියන්නේ. දේශපාලන හයිය අරගෙන කියලා තමයි වටපිටාවෙන් අපිට දැන ගන්න ලැබුණේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** එහේ ඔබතුමාට වැඩිය දේශපාලන හයියක් වෙන කාටහරි තියෙනවාද.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එහෙම නෙමෙයි ඒ අය මිනිස්සු බයකරගෙන ඉන්නේ සභාපතිතුමනි, අපි බයකරගෙන නෙමෙයි, නමුත් මිනිස්සුන්ව බයකර ගෙන ඉන්නවා. අළුත් පදිංචිකරුවන් ඉන්නේ. ඒ නිසා ගරු සභාපතිතුමනි, ඉක්මනින්ම මේකට අවධානය යොමු කරලා දූන්වීම් කිහිපයක් සවි කරන්න. මේකට ගොවිජන සේවා කොමසාරිස් දැනුවත් කරලා, ඒ අදාළ නීතිමය කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

(ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ- 06.** බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොවිඩ් 19 ආසාධිත රෝගීන් බහුලව වෙසෙන ප්‍රදේශ, රෝගය පැතිරීමේ ප්‍රවනතාවය වැඩි ප්‍රදේශ සහ ජන ඝනත්වය වැඩි ප්‍රදේශ වැඩි සැලකිල්ලට ගනිමින් මහජනතාවට එන්නත් ක්‍රියාවලිය සාධාරණව, අපක්ෂපාතීව, කිසිදු භේදයකින් තොරව ඉටුකර දෙන මෙන් මෙම ගරු සභාවට යෝජනා කරමි.

මේකෙදී මම හිතන්නේ පලිවතුගොඩ කොට්ඨාශයේ ජනතාවට එන්නත ලබා දුන්නා. අනිත් කොට්ඨාශවලටත් අපි කියන්නේ පක්ෂපාතීත්වයකින් තොරව හැකි ඉක්මනින් මේ එන්නත ලබා දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි කිසිම බලපෑමක් කරන්නේ නැහැ. ඒක සෞඛ්‍ය දෙපාර්තමේන්තුව හරහා තමයි සම්පූර්ණයෙන්ම කරන්නේ. අපි බොහොම කණගාටු වෙනවා. ප්‍රාදේශීය සභාවේ සේවකයන්ගේ සහ නිලධාරීන්ගේ පවා යම් කොටසකට එන්නත් ලබා දුන්නේ නැහැ ඔය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයෙන්. එහෙම තියෙද්දී හොර පාරෙන් කොළඹින් ගෙන්වලා උණවටුනේ තියාගෙන එන්නත් ලබා දුන්නා තමන්ගේ හිතවතුන්ට. පුද්ගලික හිතවත්කම් මත මුදලට එන්නත් ලබා දුන්නා. සභාපතිවරයා විදියට මම දැඩි අප්‍රසාදය මේ වෙලාවේදී පළ කරනවා ඔය වෙනුර කියන වෛද්‍යවරයාටත්, ඒ වගේම සෞඛ්‍ය වෛද්‍ය අධ්‍යක්ෂකතුමාටත්, ඒ වගේම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී ලසන්ත ඔබේසේකර මැතිතුමාටත්. මගේ දැඩි අප්‍රසාදය ඒ වෙනුවෙන් සභාපතිවරයා විදියට පළ කරනවා. මොකද හේතුව අපේ නිලධාරීන්ට ගෙනාපු එන්නත් ටික ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉඳන් නැවත ඉතුරු කරලා අරගෙන ගියා. අපි දන්නේ නැහැ ඒවාට මොනවා වුණාද කියලා. මම ඒකට විරුද්ධව ලියුමක් හැදුවා. කරුණාකරලා ගරු මන්ත්‍රීවරු ඒකට කැමති නම් අත්සන් කරන්න. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක ජනරාල්වරයාට පවා දන්වනවා අපිට ඇත්තටම මේ දේ වුණා කියලා. අපි ඉල්ලුවේ නැහැ අපේ ගෙවල් වල අයට. අපේ සේවකයන්, ලේකම්තුමා, තාක්ෂණ නිලධාරීන් ඉන්නවා. මේ කාර්යාලයේ අයව දෙපාරක් නිරෝධායනයට ලක් කරා. එහෙම එකේවත් අපිට එන්නත් ලබා දුන්නේ නැහැ. ඒ පිළිබඳව දැඩි අප්‍රසාදය මේ අවස්ථාවේදී පළ කරනවා.

(ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** සභාපතිතුමා පොඩි අදහසක් දක්වන්න ඕන. මොකද එදා මහජන නියෝජිතයෝ හැටියට ගිහිල්ලා මන්ත්‍රීවරු හැමෝම එන්නත විද ගත්තා. ඊට පස්සේ අපි දැක්කා ෆේස්බුක් එකේ අපිට විරුද්ධව මිනිස්සු චෝදනා එල්ල කරනවා. ඉතිං ඇත්තටම සමහරු කියන්නේ මහජන නියෝජිතවරුන්ට එන්නත් මොකටද කියලා. එහෙම කියලා ගොඩක් අපහාස කරලා තිබුණා අපිට.

**ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** රංගනී මන්ත්‍රීතුමියත් දාලා තිබුණා ෆේස්බුක් එකේ මහජනතාවට නැති එන්නත් අපිට මොකටද කියලා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** අපිට ගොඩක් අපහාස කරලා තිබුණා. ඉතිං ඒ ගැන අපේ කණගාටුව මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. සමහරු කියලා තිබුණා ගාල්ලේ නගරාධිපතිවරයා එන්නත ලබාගන්නේ නැතුව ඒක මහජනතාවට ලබා දුන්නා කියලා. ඒක ඉතිං අපි දන්නේ නැහැ කුමන හේතුවක් නිසා කරාද කියලා.

(ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** අපේ උදුල මන්ත්‍රීතුමා කියපු දේ සම්බන්ධව කරුණක් ගරු සභාපතිතුමනි මේ කියන්නේ. ඇත්තටම අපේ පලිවතුගොඩ ග්‍රාම නිලධාරි වසමේ බොහොම විනිවිදභාවයෙන් ඒ කටයුතු සිදු වුණා. ඒක මම ප්‍රකාශ කරනවා. ඒ වගේම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී අපේ සභාවේ සේවකයන් ඇතුළු ක්ෂේත්‍ර නිලධාරීන්ට ඒ එන්නත ලබා දෙන්න තීරණය කරා. ගරු සභාපතිතුමා ඒක විශ්වාස කරා ඒ වෙලාවේදී. ගරු සභාපතිතුමාට කියලා තිබුණා ප්‍රාදේශීය සභාවේ සියළු නිලධාරීන්ට සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සියළුම ක්ෂේත්‍ර නිලධාරීන්ට ඒ එන්නත දෙනවා කියලා. ඇත්තටම ගරු සභාපතිතුමනි මේ එන්නත ලබා දෙන්න දවසකට කලින් මම ලේකම්තුමාට කතා කරලා ඇහුවා කොහොමද මේ එන්නත ලබා දෙන්නේ කියලා. ඇත්තටම ඒ වෙලාවේදී පැහැදිලිව එයාලා උත්තරයක් ලබා දුන්නා නම් හරි. එහෙම නම් මම මේකෙන් අයින් වෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි එන්නත ලබා ගන්නේ නැහැ එවෙලේ මේ තීන්දුවේ හිටියා නම්.

(ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** මේ ප්‍රාදේශීය සභාවේ කසළ අදින අර අහිංසක මිනිස්සුන්ට කොවිඩ් ආසාදිත ගෙවල් වලට ගිහිල්ලා කුණු කසළ අරගෙන එනකොට අවධානමක් තියෙනවානේ. එතකොට අපි එතනදී ප්‍රමුඛතාවය දෙන්න ඕන ඒ අයට. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කරපු කැත වැඩේ නිසා මේ අහිංසක මිනිස්සුන්ට එන්නත නැති වුණා. ඒකට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමා ඇතුළු සියළුදෙනාගේ අප්‍රසාදය පළ වෙනවා. ඒක අනිවාර්යයෙන්ම විය යුතුයි. මොකද මේ අහිංසක මිනිස්සු තමයි ඒකට වන්දි ගෙවන්නේ. අපිට කලින් කිව්වා නම් මන්ත්‍රීවරු පොඩ්ඩක් ඉන්න කියලා අපි අයින් වෙනවා. එහෙම නම් කිසි ගැටළුවක් නැහැ. නමුත් ඔක්කොටම එන්නත දෙන්න පොරොන්දු වෙලා අර කරපු තුට්ටු දෙකේ වැඩේ මම සම්පූර්ණයෙන්ම හෙලා දකිනවා. බොහොම ස්තුතියි.

(ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** මෙහෙමයි ඉතිං. එතනදී ඇත්තටම ඒ කාරණය තියෙන්නේ මන්ත්‍රීවරු විදියට ඔබතුමන්ලා එතනට ගිහින් එන්නත ලබා ගන්න එක නෙමෙයි. ඇත්තටම එතනදී කරන්න තිබුණේ සභාවේ සියළුදෙනාටම එන්නත ලබා දුන්නට පස්සේ ඔබතුමන්ලා එන්නත ලබා ගත්තා නම් හරි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නැහැ මන්ත්‍රීතුමා. ඒක වැරදියි. මෙහෙමයි වුණේ. අපි සියදෙනෙක්ගේ ලැයිස්තුවක් ලබා දීලා තිබුණා. කාර්ය මණ්ඩලයේ සියළුදෙනාගේම ලැයිස්තුව අපි ලබා දීලා තිබුණේ. ඔක්කොටම ලබා දෙන්න එන්නත් ගෙනාවා කියලා තමයි තිබුණේ. අපිට ඉස්සෙල්ලා එන්නත ලබා දුන්නා. මන්ත්‍රීවරුන්ට ඒ ගෞරවය තියෙන්න ඕන. එතනට ගිහිල්ලා ඒ ගෞරවය නැති කරන්න බැහැනේ. ඒක හින්දා තමයි අපිට ඉස්සෙල්ලා එන්නත ලබා දුන්නේ. අරහෙන් එවලා තිබුණා ෆැක්ස් එකක් අපේ සියළුදෙනාව අයින් කරලා. එතනයි ගැටළුව වුණේ. නමුත් අපි එවෙලේ එතනට ගිහිල්ලා හිටියේ. අපි සටන් කරලා හැට ගාණකට එවෙලේ එන්නත ලබා දුන්නා. තිස් දෙනෙකුට එන්නත ලබා දුන්නේ නැහැ. නමුත් අපි ඊට පස්සේ වෙනත් ක්‍රමයකින්, වෙන වෙන තැන් වලින් ඒ අයට එන්නත් ලබා දුන්නා. තව ටික දෙනාටයි එන්නත ලබා ගන්න ඕන.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ලේකම්තුමාටත් එන්නත ලබා දුන්නේ නැහැ. ඒක කොච්චර කැතද, බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන රාජ්‍ය නිලධාරියා මේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මමත් අදහස් දක්වන්න හැදුවේ ඒක පිළිබඳවම තමයි. කවුරු මොන විදියේ මෙතන අදහස් දැරුවත් මම දකිනවා රටක් විදියට මේ තීන්දුව ගත්තා නම් හරි. ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු ඔක්කොම හාර දහස් ගණනයි ඉන්නේ. මේ මන්ත්‍රීවරු හාර දහස් ගණනට ඉස්සෙල්ලම එන්නත ලබා දෙන්න ඕන. මොකද හේතුව අපි දැන් ගෙවල් වලින් රණ්ඩු වෙලා තමයි එළියට යන්නේ. මම නම් එන්නත ලබා ගන්නේ නැහැ. මම එන්නත ලබා ගත්තේ මේකයි. මේ ඔක්කොම මන්ත්‍රීවරු එන්නත ගහන කොට මම එන්නත නොගහ හිටියොත් හරි නැහැ. මම එන්නත ලබා ගත්තා. මේ රටේ සියළු ජනතාවට එන්නත ලබා දෙනකම් ඉන්නවා කියන එක නෙමෙයි මම අදහස් කරේ. මම ඒක අදහස් කරේ ඇත්තටම වෙනත් හේතු උඩ. මම එන්නත ලබා නොගන්න හිටියේ. නමුත් මේ මන්ත්‍රීවරු මම එන්නත ලබා නොගත්තා නම්, මම එනකොට වසූරියකාරයා එනවා වගේ කියාවි. ඒක හින්දා කාටවත් ඒකට මුකුත් කියන්න බැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ඇත්ත කතාවක්. උදාහරණයක් තමයි මගේ කාර්යාල කාමරයට නිලධාරීන්ව ගෙන්වනවා. නමුත් සමහර නිලධාරීන් කියලා තිබුණා අපි ආරක්ෂා වෙලා වැඩක් නැහැ, සභාපතිතුමා ආරක්ෂාකාරි වෙලා නැහැ කියලා. අපි එන්නත නොගෙන හිටියා නම් ඔය ප්‍රශ්නය එනවා අබේසේකර මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒ විතරක් නෙමෙයි මම දකිනවා ඇත්තටම මේ රජයේ සේවකයෝ සියළුදෙනාටම එන්නත ලබා දෙන්න ඕන. කාර්යාලවල ඉන්න අයව එන්නත් කරන්න ඕන ඉස්සෙල්ලම. හේතුව එතනට තමයි හැමෝම මිනිස්සු යන්නේ. දැන් ලේකම්තුමාට ලබා දෙන්න එන්නත් තිබුණේ නැහැ. මම කියන්නේ මේවා මහ ජඩ විදියේ තීන්දුවක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක නෙමෙයි අබේසේකර මන්ත්‍රීතුමා හොඳම වැඩේ. කමක් නැහැ ඒක ප්‍රතිපත්තිමය තීන්දුවක් කියමුකෝ. හැබැයි හොර පාරෙන් උණවටුනට ගෙන්වලා එන්නත් ලබා දෙනවා. ඒක තමයි ෂෝක්ම වැඩේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම කියන්න යන්නෙත් ඒක තමයි. මම කියන්න හදන්නේ ඒ වසංගත එකේ ලොක්කා අපි හොඳටම දන්න අපිත් එක්ක එකට කන බොන මනුස්සයෙක්. බොහොම පැහැදිලිව මම ඉල්ලීම් කරා ඔය පිළිබඳව ඔබතුමා ඉල්ලන කොට. ඒ විතරක් නෙමෙයි මේක කියන්න

කණගාටුයි. මම දුරකථන ඇමතුම් ගත්තේ කලබල නැති වෙලාවල් වලදී. මම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි මහතාට දිගටම කතා කරා. මම අන්තිමට කෙටි පණිවිඩයක් යැව්වා. මම මේ පෞද්ගලිකව ඒවා ගන්න කතා කරන්නේ නැහැ. පොදු කාරණය ගැන කතා කරන්න දුරකථන ඇමතුම ගත්තේ කියලා කිවුවා. එන්නත පිළිබඳ නෙමෙයි, අර ලබුදූවේ තිබුණ ප්‍රශ්නයක්. ඒ ප්‍රශ්නය ගැන කතා කරන්න තමයි මම දුරකථන ඇමතුම් ගත්තේ. නමුත් ඒවා ගත්තේ නැහැ. ඊට පස්සේ වෙනත් දුරකථනයකින් මට අරගෙන කවුද, අරකද, මේකද කියලා ඇහුවම මම බැන්නා කියන්න වෙන දෙයක් නැති හින්දා. මොකද හේතුව එහෙම දුරකථන ඇමතුමක්වත් ගන්න බැහැ. හැබැයි මේකෙදී පැහැදිලිව කියන්න ඕන දෙයක් තියෙනවා. මහජන සෞඛ්‍ය පරීක්ෂක මහත්වරු ලොකු වැඩ කොටසක් කරා. ඇත්තටම මේ ඉහළින් ගන්න තීන්දු හරි වැරදියි. මම කියන්නේ මේ රජයට මුකුත් කරන්න ඕන නැහැ. මේ ප්‍රශ්නය නිසා රජය ලොකු අප්‍රසාදයකට ගියා. ඉතාම නරක විදියක් තමයි මේක. ඒක ගැන විධිමත් පරීක්ෂණයක් කරන්න ඕන. අන්තිමට සල්ලි වලට ලබා දුන්නා උණවටුනේදී. මේක තමයි ඇත්ත කතාව. මම හිතන්නේ මේකට අපි කවුරුත් ප්‍රාදේශීය සභාවේ ගෞරවය රකින්න එකතු වෙන්න ඕන. රංගනී මන්ත්‍රීතුමිය ගැන මෙතනදී කිවුවා ෆේස්බුක් එකේ දාලා තිබුණ දෙයක් ගැන. මම එතුමියගෙන් ඇහුවම කිවුවා එහෙම එකක් නෙමෙයි මන්ත්‍රීතුමා කියලා. මම ඒකට කමෙන්ට් එකකුත් දැම්මා මෝඩ කතා කියන්න එපා මෙහෙම මෙහෙමයි කියලා. එතුමිය එහෙම හිතලා නෙමෙයි ඒක කරේ. මොකද, බහුතරයක් දෙනා සමහර රෝග වලින් පෙලෙනවා. සමහර අය මේ එන්නත ලබා ගන්න බයයි, ඇත්ත කතාව ඒක. ඉතිං ඒක හින්දා සජිත් ප්‍රේමදාස මැතිතුමා වගේ කවුරුහරි හිතාගෙන ඉන්නවා නම් රටේම මිනිස්සුන්ට එන්නත ලබා දුන්නම තමයි එන්නත ලබාගන්නේ කියලා, ඒක අමු කුණුහරුපයක්. මට හිතෙනවා ඒක රංගනයක්ද කියලා අනුකම්පාව ලබා ගන්න. ඉතිං මේවා නිකං ගොන් පාට්නේ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ- 07.** කරාපිටිය සනි සයිඩ් ගම්මානයේ කාපට් දමා ඇති මාර්ගය දෙපස කාණු පද්ධතිය කොන්ක්‍රීට් කර දෙන ලෙස ගරු සභාවට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමාගේ යෝජනා</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** චනක මන්ත්‍රීතුමා, මහා සභා රැස්වීමට තවම සහභාගි වෙලා නැති නිසා එම යෝජනාව මම ඉදිරිපත් කරන්නම්.

**08.** මුලන ගම්මානයේ ප්‍රධාන පිවිසුම් මාර්ගය මේ වන විට කාපට් යොදා සංවර්ධනය කරමින් පවතින අතර මුලන වැලිහන්දිය, 300/2, මුලන, නරාවල, පෝද්දල ලිපිනයේ නිශාන්ත ධම්මික මහතාගේ වෙළඳසැල (කළු අයියාගේ කඩය) මාර්ගයේ ඇති කාණු පද්ධතිය අවහිර කරමින් ඉදිකර ඇති බැවින් එම අනවසර ඉදිකිරීම් කොටස කඩා ඉවත්කර මාර්ගය සකස්කිරීමට කටයුතු කරන ලෙස යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමාගේ යෝජනා</u>**

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ- 09.** අප ප්‍රාදේශීය සභාවේ සේවකයන් හා නිලධාරීන් කොවිඩ් 19 එන්නත්කරණ කටයුත්තේදී අපහසුතාවයට ලක්කිරීම පිළිබඳව ගරු දකුණු පළාත් ආණ්ඩුකාරතුමා, දකුණු පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂක, ගාල්ල දිස්ත්‍රික් සෞඛ්‍ය අධ්‍යක්ෂක සහ දකුණු පළාත් පළාත් පාලන කොමසාරිස්තුමා මෙන්ම ගරු සෞඛ්‍ය අමාත්‍යතුමිය සහ ගරු වැවිලි අමාත්‍යතුමා දැනුවත් කිරීම සඳහා යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** දැන් අපි මීට කලිනුත් මේ යෝජනාවම දාලා තියෙනවානේ. ලිපියක් සකස් කරලා තියෙනවා. මම හිතන්නේ මේ වෙන කොටත් ලිපියක් සකස් කරලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි මීට කලිනුත් ලිපි යැව්වා මන්ත්‍රීතුමා ආණ්ඩුකාරතුමාට. අපි නැවත මේ සියළු සිද්ධිය සවිස්තරාත්මකව සෞඛ්‍ය අධ්‍යක්ෂක ජනරාල්තුමාට, ආණ්ඩුකාරතුමාට සහ රමේෂ් පතිරණ ඇමතිතුමාටයි යවන්න ලිපියක් සකස් කරා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** සභාවේ මන්ත්‍රීවරු හැටියට අපි ඒ අවස්ථාවේදී දැඩි අපහසුතාවයට පත් වුණා. ලැයිස්තු හදලා ඉවරවෙලා එන්න කියලා පළමුව අපිට එන්නත්කරණය සිදු කරලා ඉවර වුණා. අපිටත් ඒ වෙලාවේ කතා කරන්න බැරි තත්ත්වයකට මේක පත් කරා. මේ සභාවේ ලේකම්තුමා

ඇතුළු කාර්ය මණ්ඩලය අපහසුතාවයට පත් කරා. ඉතිං ඒකට අපි සභාවක් විදියට පොදුවේ විරෝධතාවය දක්වන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මම මේ අවස්ථාවේදීම මේක කියනවා. අපේ සභාවේ විපක්ෂ නායක හුසේන් කියාස් මන්ත්‍රීතුමාගේ මන්ත්‍රීධූරය අහෝසි කරලා තියෙනවා. ඉතිං ඇත්තටම එක්සත් ජාතික පක්ෂයට මන්ත්‍රීවරු හත් දෙනෙක් නියෝජනය කරන්න අවස්ථාව ලැබුණේ ඒ කුරුඳුවත්ත කොට්ඨාශය එතුමා ඡන්ද තුන්දහස් පන්සියයක් පමණ ලබා ගෙන ජයග්‍රහණය කරපු නිසා. එක්සත් ජාතික පක්ෂයේ නායකයා සහ ඒ වගේම ගාල්ල දිස්ත්‍රික්කයේ නායකයා කියලා කියා ගන්න අය ඉන්නවා. මම දන්නේ නැහැ දැන් එක්සත් ජාතික පක්ෂය තියෙනවා කියලවත්. වජිර අබේවර්ධන මැතිතුමා රෙද්ද ඇඳගෙන හිටියේ ඔය කියාස් මන්ත්‍රීතුමා ඇතුළු මුස්ලිම් ජනතාව නිසා. දකුණු පළාතෙන්ම ගාල්ල ආසනය විතරක් ජයග්‍රහණය කෙරෙව්වේ මුස්ලිම් ජනතාවගේ හයිය අරගෙන මිසක් වජිර අබේවර්ධන මැතිතුමාගේ තියෙන සුවිශේෂි දක්ෂතාවයක් නිසා නෙමෙයි. ඉතිං එවැනි එක්සත් ජාතික පක්ෂයට ගාල්ල දිස්ත්‍රික්කයේ හයියක් වෙච්ච මුස්ලිම් ජනතාවට කරන ලොකුම අගෞරවය තමයි හුසේන් කියාස් මන්ත්‍රීවරයාව මේ අවස්ථාවේදී අයින් කිරීම. ඒක කරලා එතනදී නිකං ඉන්නේ නැහැ. ඉදිරියට මුස්ලිම් ජනතාව ගාවට යන්න බැරි තත්ත්වයට එක්සත් ජාතික පක්ෂය වලපල්ලට ඇදගෙන යන්නේ වජිර අබේවර්ධන මැතිතුමාගේ අමන තීන්දුව නිසා. ඉතිං ඒ නිසා මම ඒ ක්‍රියාවලිය දැඩි සේ හෙලා දකිනවා. මේ සභාව නියෝජනය කරපු එකම මුස්ලිම් මන්ත්‍රීවරයා මේ. මුස්ලිම් නියෝජනයක් දාන්න තිබුණා මේකට ගිංතොට ඒ කොට්ඨාශයෙන්ම. දැන් ඒක සම්පූර්ණයෙන්ම මුස්ලිම් ජනතාවට කරන දැඩි හානියක් කියලා මම මේ වෙලාවේදී ප්‍රකාශ කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, ඒක පිළිබඳව මමත් විනාඩියක් අදහස් දක්වන්නම්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අබේසේකර මන්ත්‍රීතුමා අපි ඒක ගැන වෙනම කතා කරමු.

**(ඊ) කාරක සභාවල වාර්තා ඃ-**

**01. මුදල් සහ ප්‍රතිපත්ති සැකසුම් කමිටුව**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** I. 2021-06-02 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසුම් කමිටුව

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**02. තාක්ෂණික සේවා කමිටුව :- නැත**

**03. නිවාස සහ ප්‍රජා සංවර්ධන කමිටුව :- නැත**

**04. පරිසරය සහ පහසුකම් කමිටුව :- නැත**

**(උ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලීම ඃ- නැත.**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2021 වර්ෂයේ මැයි මස මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය (ප්‍රා.ස. 16), 2021 වර්ෂයේ මැයි මස මාසික ඒකාබද්ධ වැය සාරාංශය (ප්‍රා.ස.14) සහ 2021 වර්ෂයේ මැයි මස මාසික ඒකාබද්ධ හිඟ ආදායම් ප්‍රකාශය (ප්‍රා.ස. 07) ඉදිරි මහා සභාවේදී සභා සම්මත කිරීම සඳහා ඉදිරිපත් කරන්නම්.

**04. වෙනත් ලේඛන ඃ-**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 01. දැනට ක්‍රියාත්මක වෙන සංචරණ සීමා තත්ත්වය යටතේ මාසික බදු මුදල් ගෙවීමේ අපහසුතාවය. (ලබුදූව සාප්පු සංකීර්ණ වෙළඳ සංගමය)

දැනට අපි මේක ඉදිරිපත් කරනවා. ලබන මහා සභාවට විධිමත් යෝජනාවක් විදියට අපි ඒක ඉදිරිපත් කරන්නම්. මොකද ඒක සාධාරණයි. අනිත් සියළුම ඒවාටත් ඒක අදාළයි. ඒකට දැනට අපි තීරණයක් ගමු ගාස්තු අය නොකර ඉන්න. ඊට පස්සේ නැවත අපි විධිමත් සභා තීන්දුවක් ගමු.

**(ඉ) රැස්වීම් කැඳවීම් දැන්වීමේ දක්වා ඇති වෙනත් කාරණා**

**පසුගිය මහා සභා රැස්වීම් සඳහා ඉදිරිපත් කරන ලද යෝජනාවල ප්‍රගතිය සමාලෝචනය**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2021 වර්ෂයේ ජුනි මස මහා සභාවට ඉදිරිපත් කරන ප්‍රගතිය සමාලෝචනය.

මන්ත්‍රීවරුන්ට අදහස් දක්වන්න අවස්ථාව ලබා දෙනවා. පැය භාගය දැනටමත් අවසන්. අපි පුළුවන් තරම් කෙටියෙන්, අඩුවෙන් කතා කරලා සභාවේ වැඩ කටයුතු අවසන් කරමු.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, පළමුවෙන්ම හුසේන් කියාස් මන්ත්‍රීතුමාට අපගේ කණගාටුව ප්‍රකාශ කරනවා. මොකද එතුමා විසින් උක්වත්ත, කුරුඳුවත්ත, ගිංතොට ප්‍රදේශයට විශාල මහජන සේවාවක් කරපු ප්‍රාදේශීය නායකයෙක් හැටියට අපිට හඳුන්වන්න පුළුවන්. ඉතිං එතුමාගේ මන්ත්‍රීධූරය අවසන්වීම ඇත්තටම අපි මන්ත්‍රීවරු හැටියට මේ අවස්ථාවේදී හෙලා දකිනවා. ඒ වගේම කණගාටුව ප්‍රකාශ කරනවා පක්ෂ විපක්ෂ භේදයකින් තොරව එතුමා වෙනුවෙන්.

ඒ වගේම මේකත් මතක් කරන්න ඕන ගරු සභාපතිතුමනි, දැන් ලබුදූව වෙළඳ සංකීර්ණයේ වෙළඳ සංගමය විසින් ලිපියක් ඉදිරිපත් කරලා තිබුණා. ලබුදූව වෙළඳ සංකීර්ණයේ මේ දවස්වල සියළු වෙළඳසැල් වසා තිබෙන නිසා ඇත්තටම ඒ වෙළඳසැල් හිමියන් ඉතාමත් අපහසුතාවයට ලක් වෙලා තිබෙනවා. ඉතිං අපි ඒ සඳහා එයාලට මේ මාසය සඳහා හරි, ගිය මාසය සඳහා හරි කාලෝචිත පියවරක් අරගෙන ඒ බදු මුදල් මේ මාස දෙක ඇතුළත ඉවත් කරන මෙන් මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ වගේම මතක් කරන්න ඕන ගොඩකන්ද මාවත, රන් මාවත කියලා නම් කරා පහුගිය කාලයේදී. නමුත් අද වෙනකම් කිසිම මාර්ග ප්‍රතිසංස්කරණ කටයුත්තක් සිදු වුණේ නැහැ. උඩින් පැච් දාලා ඒවා වැහුව එක විතරයි කරේ. මම හිතන්නේ ඒ පාරත් කාපට් යොදා සංවර්ධනය කරනවා නම් හොඳයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ පාර කාපට් කිරීමට යෝජිතයි. ලියනගේ මන්ත්‍රීතුමාගේ යෝජනාවක් අනුව ඒකෙ කටයුතු ඔක්කොම දැන් අවසාන මට්ටමේ තියෙන්නේ. මම හිතන්නේ දැන් ඒක ඇස්තමේන්තු කරලා, ටෙන්ඩර් කරලා ඉවරයි. ටෙන්ඩර් එකත් ප්‍රදානය කරලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, ඒකෙ වැඩ කවදා වගේද දන්නේ නැහැ පටන් ගන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොහොම හරි මාසයක්, එක හමාරක් ඇතුළත වැඩ පටන් ගනීවි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ඒ වගේම මතක් කරන්න ඕන ගරු සභාපතිතුමා වැලිකැටිය වත්ත මාර්ගය ගැන. මම දැන් කාලයක් තිස්සේ ඉඳන් ඒකට ඉල්ලීම් කරනවා. නමුත් අද වෙනකම් ඒකට ප්‍රතිචාරයක් නැහැ. මොකද රුපියල් ලක්ෂ තිස් පහක් විතර ඒකට යනවා. මම හැමදාම ඒක ගැන අහනවා. නමුත් ඒකට කිසිම ප්‍රතිචාරයක් නැහැ. ඒකයි මම මේක නැවතත් මතක් කරේ. මොකද ඒක කරලා දෙන්නම් කියලා දිගින් දිගටම කිවුවා. නමුත් ඒක තාම කරලා දුන්නේ නැහැ.

ඒ වගේම ඉන්ධන මිල වැඩිවීම සම්බන්ධව මම මගේ කණගාටුව ප්‍රකාශ කරනවා. මොකද, ඉන්ධන මිල වෙනදට වැඩිය ලොකු ප්‍රමාණයකින් මේ වර්ෂයේදී වැඩි වෙලා තියෙනවා. ඒ ගැනත් මගේ කණගාටුව මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මම පළමුවෙන්ම අදහස් දක්වන්න ඕන අපේ කියාස් මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නය පිළිබඳව. ඇත්තටම කියාස් මන්ත්‍රීතුමයි, මමයි දෙන්නා එකම කාලයකදී තමයි මේ ප්‍රාදේශීය සභාව නියෝජනය කරන්න එන්නේ. එතුමා ස්වාධීන අපේක්ෂකයෙක් විදියට අල්මාරිය ලකුණින් තරග වැදිලා සභාවට එනවා. මම එක්සත් ජාතික පක්ෂයෙන් තරග වැදිලා සභාවට එනවා. ඉතිං ඇත්තටම එතුමා මගේ හොඳ මිත්‍රයෙක්. ඒ කාලයේදී අපි එක්කහු වෙලා තමයි වැඩ කරේ. ඒ ඡන්දය යන කොටත්, අපි නිතරම හජ්ජියාර් මහතාගේ නිවසට එකතු වෙලා කතා කරලා තමයි ගියේ. හැබැයි එකක් තියෙනවා. තමුන්නාන්සේලා ලොකු චෝදනාවක් කරා එතුමාගේ අස්කිරීම පිළිබඳව. එතුමා නැතිවීම නිසා මුස්ලිම් ජනතාවගේ නියෝජනය නැතිවීම පිළිබඳව ප්‍රශ්නයක් තියෙනවා. හැබැයි එතුමා හිටියේ එක්සත් ජාතික පක්ෂයේ. දැන් මොන දේශපාලන මතය දැරුවත් මම අද ඉන්නේ එක්සත් ජාතික පක්ෂයේ. ඉතිං එතකොට දැන් එක්සත් ජාතික පක්ෂය කියන්නේ විරුද්ධ පක්ෂය. අපේ සභාපතිතුමා නම් මේකට සන්තෝෂ වෙනවා. මොකද එතුමා ඕන විදියට කීකරුවෙලා ගියා. හැබැයි විරුද්ධ පක්ෂයේ නායකයෙක් විදියට එතුමා තමන්ගේ යුතුකම් ඉෂ්ඨ කරේ නැහැ කියන එක මම කියනවා. මුස්ලිම් ජනතාව වෙනුවෙන් පාරවල්, අරවා මේවා කරා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ කතාව වැරදියි අබේසේකර මන්ත්‍රීතුමා. දූන් පහුගිය ටෙන්ඩර් ප්‍රදානයේදී එතුමා විරුද්ධ වෙලා හිටියා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමා මේක කියලා ඉවර වුණාම කතා කරන්න. ගරු සභාපතිතුමා, විරුද්ධ පක්ෂයක ප්‍රධානම දේ තමයි අයවැයට විරුද්ධවීම. මොන ආණ්ඩුවක් තිබුණත්, මොකක් තිබුණත් ආණ්ඩු පක්ෂයට, විරුද්ධ පක්ෂයේ අය ඡන්දය ලබා දෙනවාද, එහෙම ඡන්දය ලබා දෙන්නේ නැහැ. එතුමා ඇත්තටම තමන්ගේ ප්‍රදේශයට සේවය කරන්න බැලුවා. ඔබතුමන්ලාගේ ළඟට ඇවිල්ලා වොයිස්කට් එකක් දීලා හරි ඒක කරන්න බැලුවා. ඉතිං පක්ෂයක් විදියට ගනිපු තීන්දුව ගැන කණගාටුවක් තියෙනවා. හැබැයි මුස්ලිම් ජනතාවගේ නියෝජිතයෙක් සභාවේ සිටිය යුතුයි කියන මතයේ මමත් ඉන්නවා. මොකද හේතුව ඒක නියෝජනය වෙන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං පත් කරන්න තිබුණානේ මුස්ලිම් නියෝජිතයෙක්ව.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක මගේ වැඩක් නෙමෙයි ගරු සභාපතිතුමා. මම කිවුවේ මගේ ප්‍රශ්නය ගැන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම නම් ඔය ගැන කතා කරලා වැඩකුත් නැහැ. ඇත්ත කතාව ඒක.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** හිටපු මන්ත්‍රී කුලරත්න මැතිතුමා කියන්නේ අපි කාගෙත් හිතවත් මන්ත්‍රීවරයෙක්. ඉතිං එතුමාව තමයි පත් කරලා තියෙන්නේ. ඉතිං ඒවායේ හරි වැරදි නිවැරදි කරන්න අපිට බැහැ. මේ පක්ෂ වල අපි දැක්කේ උඩ ඉඳලා පහළට යනකම්ම මේක තියෙනවා. මම දන්නේ නැහැ මේ තීන්දුවත් ගත්තේ කොහොමද කියලා. මේක ගත්තේ මොන පදනමෙන්ද කියලා මම දන්නේ නැහැ. ඒ විනය පරීක්ෂණ තියෙනවා නම් මේ සියළුදෙනාටම තියන්න ඕන. මම මේක කියන්නේ ඔබතුමන්ලා කවුරුවත් එක්ක තියෙන තරහකට නෙමෙයි. හැබැයි මේක කොහෙන් හරි පටන් අරගෙන තියෙනවා. හැබැයි මේක වැරදි තැනකින් තමයි අල්ලාගෙන තියෙන්නේ. ඉතිං මේක තමයි ඒකට කියන්න තියෙන්නේ.

ඊළඟට දෙයක් කියන්න ඕන. මස් කඩ ගැන කතා කරා. මේක අත්‍යාවශ්‍ය දෙයක්. මස් කියන එක අත්‍යාවශ්‍ය දෙයක්. ඒක හින්දා මේවා අත්‍යාවශ්‍ය සේවාවක් විදියට වෙන මොකක් හරි ඉඩකඩක් හදලා දෙන්න ඕන මිනිස්සුන්ට නීත්‍යානුකූලව ගිහිල්ලා ඒ ටික ගන්න. මොකද මේ වසංගතයට තියෙන්න ඕන එක දෙයක් තමයි හොඳට කාලා බීලා ඉන්න එක. බොන එකනම් නැති වුණාට කමක් නැහැ. නමුත් හොඳට කාලා ඉන්න ඕන.

**ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** අපිටත් කතා කරන්න ඕන. ඔබතුමා හැමදාම කතා කරනවා. අපිටත් විනාඩිය ගාණේ හරි කතා කරන්න ඕන.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමියට මම කියන්නම් හැමදාම කතා කරන එක ගැන. ඔබතුමිය ඕන තරම් කතා කරන්න. නමුත් කවදාවත් කතා කරලා නැහැ මේකෙ තියෙන දේවල් ගැන, පාරක් ගැන අරක මේක ගැන කතා කරා මිසක්. මගේ කතාව කරාට පස්සේ ඔබතුමිය කතා කරන්න. මගේ කතාවට මොකක්ද ඔබතුමියට තියෙන ප්‍රශ්නය.

(ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** ප්‍රශ්නයක් නම් නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ප්‍රශ්නයක් නැත්නම් ඉන්න. මම හැමදාම කතා කරලා තියෙන්නේ මේ ප්‍රදේශයේ තියෙන ප්‍රශ්න ගැන. ඔබතුමියන්ලා ඒවාට ඇවිල්ලත් නැහැ, කතා කරලත් නැහැ. දූන් එනවා මේවා ගැන කතා කරන්න. එහෙම කරන්න එපා මන්ත්‍රීතුමිය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි. ඔබතුමා කතා කරන්නකෝ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක තමයි මමත් කිවුවේ. අඩු ගාණේ මූලාසනය එහෙම කියනවා නම් කමක් නැහැ. ඔයගොල්ලොන්ට අපි කවදාවත් කිවුවද කතා කරන්න එපා කියලා.

ඉතිං ගරු සභාපතිතුමනි, මේක අත්‍යාවශ්‍ය සේවයක් විදියට මේවා කරන්න ඕන. ඊළඟට ගරු සභාපතිතුමනි, දිගින් දිගටම මේවා පස්සට යනවා. ඒ කියන්නේ මේක එක්තරා අන්දමක ආශිර්වාදයක් වෙලා තියෙනවා. මේ අනවසර ඉදිකිරීම්, අනවසර ගොඩකිරීම් කියන ප්‍රශ්නයේදී මේක ඒ අයට ලොකු ආශිර්වාදයක් වෙලා තියෙනවා. දූන් මම නම් මේක සමාජ මාධ්‍ය හරහා කරන්න පටන් ගත්තා. මම කියනවා ඔබතුමන්ලා සියළු දෙනාටමත් ඒක පටන් ගන්න කියලා. මොකද ඒක හොඳයි. ඒක නිසා ඊළඟ සභාවට කලින් අපි විශේෂ සභාවක් ඉල්ලන්න වාතාවරණය තිබ්බොත් ඒක ඉල්ලනවා. මේ පිළිබඳව තීන්දුවක් ගන්න ඕන. මොකද හේතුව නාගරික සංවර්ධන අධිකාරිය හැසිරෙන විදිය අන්තිම නරක තැනක තියෙන්නේ. ඔබතුමන්ලා ඒක දන්නවා.

ටෙක්ලා මන්ත්‍රීතුමිය හිත රිදුණා නම් කරුණාකරලා සමාවෙන්න. මොකද හේතුව මෙච්චර කාලයක් මම කතා කරන කොට එහෙම බාධා කලේ නැහැ තමන්ගේම මිනිස්සු. මේ කතා කරන්නේ ඔබතුමිය ඉන්න කණ්ඩායම වෙනුවෙන්. ඉතිං මන්ත්‍රීතුමිය, ඔබතුමිය ඕවා ගණන් ගන්න එපා. ඉතිං මම මීට වැඩිය කතා කරන්න යන්නේ නැහැ. අනවසර ඉදිකිරීම් සහ අනවසර ගොඩකිරීම් පිළිබඳ ඒ ප්‍රශ්නයේදී ගරු සභාපතිතුමා මොකක් හරි කමිටුවක් විදියට අපි එකතු වෙලා හරි ඒ තීන්දු තීරණ ගමු ඉදිරි කාලයේදී.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා ඇතුළු සියළු මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි. කියාස් මන්ත්‍රීතුමා ගැන අපි ඇත්තටම කණගාටු වෙනවා සභිකයෙක් විදියට මේ සභාව නියෝජනය කිරීම අවසන් කරන එක ගැන. නමුත් එක පක්ෂයක තනතුරක් දරණ ගමන් තවත් පක්ෂයක සාමාජිකත්වය අරගෙන, ඡන්දය ඉල්ලීමක් කරලා එහෙම යන්න බැහැ. ඒක තමයි මේකෙ තියෙන නීතිමය පැත්ත. ඒක මට තව විග්‍රහ කරන්න පුළුවන්. නමුත් අපිට ඒකට කරන්න දෙයක් නැහැ. ඒක පක්ෂයේ තීන්දුවක්. අපිට වුණත් එහෙම තමයි, ඔබතුමන්ලාට වුණත් එහෙම තමයි. නමුත් අපි ඇත්තටම කණගාටු වෙනවා මුස්ලිම් ජනතාව නියෝජනය කරන්න මෙතන නියෝජිතයෙක් නැති වීම සම්බන්ධව. මමත් ඒ කිට්ටුවෙන් ජීවත් වෙන කෙනෙක් විදියට මම පෞද්ගලිකවත් අපි හැමෝගේම කණගාටුව ප්‍රකාශ කරනවා විනා අපිට වෙන දෙයක් ඒ සම්බන්ධව කතා කරන්න අවශ්‍ය නැහැ.

මේ කොවිඩ් එන්නත් ලබා දීම සම්බන්ධව සභාපතිතුමා දැඩි උත්සාහයක් අරගෙන කටයුතු කිරීම සම්බන්ධව ස්තුතිවන්ත වෙනවා. මේ එන්නත අපි කවුරුවත් මන්ත්‍රීවරුන්ට පළමුවෙන් ලබාගන්න යන්න ඕන කියලා කිසිම වුවමනාවක් තිබුණේ නැහැ. මම මේ මන්ත්‍රීවරු එක්ක බොහොම සුහදව ඉන්න කෙනෙක්. ඒක නිසා අපිට තමයි පළමුවෙන්ම අවස්ථාව ලබා දීලා දුරකථන ඇමතුම් ලබා දුන්නේ. අනෙකුත් අයටත් යම් යම් වෙලාවල් ලබා දීලා තිබුණා. දහවල් දොළහටත් වෙලාවල් ලබා දීලා තිබුණා. නමුත් මන්ත්‍රීවරු විදියට අපිට ප්‍රමුඛතාවය ලබා දුන්නා ඒ අය. ඒකට අපි ඉල්ලීම් කරේ නැහැ. මම හිතන්නේ ඒකට සභාපතිතුමත් ඉල්ලීමක් කරේ නැහැ මන්ත්‍රීවරුන්ට ඉස්සෙල්ලා එන්නත් ලබා දෙන්න කියලා. නමුත් ඒකෙදී විවේචනයන් කරන්නේ නොදැනුවත්කමට. මෙතන වෙච්ච ප්‍රායෝගික ක්‍රියාවලියට විරුද්ධ වීම තමයි ඒ අය කරේ. ඒක නිසා මේකෙදී කාටහරි චෝදනාවක් තියෙනවා නම් අපේ සේවක මණ්ඩලයට එන්නත් ලබා නොදීම සම්බන්ධව, ඒකට මම පෞද්ගලිකව කණගාටු වෙනවා. මම අන්තිම මොහොතේ අපේ ගෙදර අය එක්ක සාකච්ඡා කරා මේකට යන්න ඉස්සෙල්ලා. ඒ අයට නැතුව මට එන්නත් මොකටද කියලා ගෙදර අයත් එක්ක මම කතා කරා. නමුත් මගේ බිරිඳ කිව්වේ මළගෙදරට, දාන ගෙදරට, හැම තැනටම සහභාගි වෙන නිසා මට එන්නත ලබා ගන්න කියලා. නැත්නම් මට මේකට කොහොමත් වුවමනාවක් තිබුණේ නැහැ. නමුත් මේකෙදී ඒ මන්ත්‍රීවරුන්ට චෝදනා කරන එක වැරදියි. ඒ සිද්ධියේදී අපි සභාපතිතුමා එක්ක ඉන්නවා. සභාපතිතුමා ගේන ඕනම දේකට අපි අත්සන යොදනවා. ඒක හරි පැහැදිලියි.

අනිත් එක තමයි මම මේ කළුපටියක් පැළඳගෙන ආවේ කාටවත් අපහසුතාවයට ලක් කරන්න නෙමෙයි. ජනතාව අපහසුතාවයට ලක් වෙච්ච තීන්දුවක් අරගෙන තියෙනවා. මම දන්නවා පෞද්ගලිකව අපි හැමෝම ඉන්ධන වලින් මෝටර් බයිසිකලයක් හරි දුවන අය. මේ වෙලාවේදී අපිට ලොකු පීඩනයක් ඇති වෙලා තියෙනවා. මම නියෝජනය කරන පිරිසට සාධාරණයක් කරන්න මට පුළුවන් දේ විරෝධයක් විදියට පානවා. මම මේ අවස්ථාවේදී දැඩි පිළිකුලෙන් හෙලා දකිනවා ඒ ඉන්ධන මිල වැඩි කිරීම සම්බන්ධව.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හැබැයි මන්ත්‍රීතුමා මේ සම්බන්ධව යම් ප්‍රකාශයක් කරන්න ඕන. ඉන්ධන මිල වැඩිවීම පිළිබඳව කතා කරන්න ඕන. ඔය ඉන්දික මන්ත්‍රීතුමන්ලා කොයි වෙලාවකවත් යහපාලන ආණ්ඩුව කාලේ විරුද්ධ වුණේ නැහැ මේකට. හැම මාසයකම දහවෙනිදාට මිල සූත්‍රයක් කියලා එකක් ගෙනාවා. ඒකෙන් හැම මාසයකම දහ වෙනිදාට ඉන්ධන මිල මාසයෙන් මාසයට වැඩි කරද්දී මෙතුමන්ලාගේ ජනතා විමුක්ති පෙරමුණ හිටියේ කොහේද දන්නේ නැහැ. හොඳට මතක ඇති. යහපාලන ආණ්ඩුව හැම මාසයකම දහවෙනිදාට ඉන්ධන මිල වැඩි කරා මිල සූත්‍රයක් ගෙනල්ලා.

(ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා ඃ-** ඒක අඩු වුණා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොයි වෙලාවකවත් අඩු වුණේ නැහැ.

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා ඃ-** අඩු වුණා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අඩු වුණේ එක පාරයි. එක මාසයයි අඩු වුණේ. අනිත් හැම මාසයකම මිල වැඩි කරා. අමතක කරන්න එපා දැන් මේ ආණ්ඩුව ඇවිල්ලා අවුරුදු එකහමාරක් වෙනවා.

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා ඃ-** පෙට්‍රල් මිල රුපියල් එකසිය දාහතට බැස්සුවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** පොඩ්ඩක් ඉන්න කියන්න. බොරතෙල් මිල වැඩිවෙලා තියෙනවා. කවුරුත් ඒක පිළිගන්නවාද, බොරතෙල් මිල අඩු වුණේ නැහැ, වැඩි වෙච්ච එක වුණේ. මම ඔබතුමන්ලාගෙන් අහන්න කැමතියි රටක් විදියට දැන් මේ රටට මොකක්ද තියෙන ආදායම. සංචාරක කර්මාන්තය සම්පූර්ණයෙන්ම ඉවරයි. විදේශිකයන් පැමිණෙන එක සම්පූර්ණයෙන්ම ඉවරයි. මේක මේ ආණ්ඩුවේ අකාර්යක්ෂමතාවය නෙමෙයි. මේ කොරෝනා වසංගතයත් එක්ක මේ රටේ ආර්ථික තත්ත්වය සම්පූර්ණයෙන්ම වැටිලා තියෙන්නේ. ඉතිං එහෙම තියෙන කොට ඔබතුමන්ලා ජනතාවටත් සහන ඉල්ලනවා. එන්නත්කරණය කරන්න කියලත් කියනවා. ඊට පස්සේ පී.සී.ආර්. පරීක්ෂණ කරන්න කියලත් කියනවා. මේවාට වියදම් වෙනකොට රටට ආදායමක් එන්නේ කොහොමද. ඔය සරදියෙල් වගේ ඔහොම බැඳගෙන ආවේ නැහැ යහපාලන ආණ්ඩුව කාලේ මාසයෙන් මාසයට ඉන්ධන මිල වැඩි කරන කොට. ඔය විකට රංගන එදා කරේ නැහැ. ඒවා එදා කරේ නැහැ. අපි උද්ඝෝෂණය කරේ මාසයෙන් මාසයට ඉන්ධන මිල වැඩි වෙද්දි. ඒ වෙන කොට රටට කිසි ප්‍රශ්නයක් තිබුණේ නැහැ. රටේ කිසි උවදුරක් තිබුණෙත් නැහැ.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** අපි පිළිගන්නවා මිනිස්සු මේ වෙලාවේ අමාරුවේ වැටිලා ඉන්න වෙලාව කියලා. නමුත් රටක් විදියට මෙහෙම නැතුව යන්න බැහැ.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ៖-** අපි ආණ්ඩුව ගන්නකොට ප්‍රෙටල් මිල රුපියල් එකසිය පනස් හතයි. ඒක රුපියල් එකසිය දාහතට දුන්නා. රුපියල් එකසිය තිස් හතර වෙනකම් අපේ ආණ්ඩුව කාලයේදී මිල ගියා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** දැන් එතකොට ලෝක වෙළඳ පොලේ බොරතෙල් බැරල් එකක මිල කීයද. කෝ අර පිහිටවනවා කියපු අරමුදල.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ៖-** සභාපතිතුමා, දැන් මිල කීයද කියලා නෙමෙයි අපි අහන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** මේකට මට උත්තරයක් දෙන්න බැහැ. මේක මට අඩු කරන්න පුළුවන් නම් මම ඒක කරනවා. මට තෙල් මිල අඩු වැඩි කරන්න පුළුවන් මට්ටමක් තියෙනවා නම් මම ඒක කරනවා. නමුත් මට ඒක කරන්න බැහැනේ. මම කොහොමද උත්තර දෙන්නේ. අපෙත් එකඟතාවයක් නැහැ මේක මේ වෙලාවේදී කරපු එක ගැන. අපි කිවුවේ මේක කළ යුතුයි, නමුත් තව පහු කරලා මේක කරන්න තිබුණේ. අපෙත් එකඟතාවයක් නැහැ මේකට.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ៖-** ගරු සභාපතිතුමනි, 2015 ට කලින් පෙට්‍රල් ඔක්ටේන් අනූ දෙක තිබුණේ රුපියල් එකසිය හැට දෙකකට. පෙට්‍රල් ඔක්ටේන් අනූ පහ තිබුණේ රුපියල් එකසිය හැත්තෑ අටකට. ඔටෝ ඩීසල් තිබුණේ රුපියල් එකසිය එකොළහට. සුපිරි ඩීසල් තිබුණේ රුපියල් එකසිය තිස්තුනට. භූමිතෙල් තිබුණේ රුපියල් එකසිය හයකට. 2015 ට කලින් දත්ත මම මේ කියන්නේ. එතකොට 2015 වර්ෂයේදී පෙට්‍රල් ඔක්ටේන් අනූ දෙක තිබුණේ රුපියල් එකසිය දාහතට. පෙට්‍රල් ඔක්ටේන් අනූ පහ තිබුණේ රුපියල් එකසිය විසි අටට. ඔටෝ ඩීසල් තිබුණේ රුපියල් අනූ පහට. සුපිරි ඩීසල් තිබුණේ රුපියල් එකසිය දහයට. භූමිතෙල් තිබුණේ රුපියල් හතලිස් හතරට. එතකොට 2018 වර්ෂයේදී ඉන්ධන මිල සූත්‍රයට අනුව පෙට්‍රල් ඔක්ටේන් අනූ දෙක තිබුණේ රුපියල් එකසිය තිස් හතට. පෙට්‍රල් ඔක්ටේන් අනූ පහ තිබුණේ රුපියල් එකසිය හතලිස් අටකට. ඔටෝ ඩීසල් තිබුණේ රුපියල් එකසිය නවයකට. සුපිරි ඩීසල් තිබුණේ රුපියල් එකසිය දහනවයට. 2021 වර්ෂය මේ වෙනකොට වැඩිවුණා. පෙට්‍රල් ඔක්ටේන් අනූ දෙක රුපියල් එකසිය පනස් හතක් වෙනවා. පෙට්‍රල් ඔක්ටේන් අනූ පහ රුපියල් එකසිය අසූ හතරක් වෙනවා. ඔටෝ ඩීසල් රුපියල් එකසිය එකොළහක් වෙනවා. සුපිරි ඩීසල් රුපියල් එකසිය හතලිස් හතරක් වෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** මම කියන්නේ ලෝක ඉතිහාසයේ රට වැටිච්ච අමාරුම තැන මෙතන. ඉතින් ඒක කවුරුත් පිළිගන්න ඕන කාරණාවක්නේ. අනිත් එක ජනාධිපතිතුමා ඇතුළු අනෙක් අය ගෙදරින් ගෙනත් දෙනවද. ජනාධිපතිතුමා තමන්ගේ වැටුප පවා පරිත්‍යාග කරලා තියෙන්නේ. තමන්ගේ මාස හයක වැටුප ජනාධිපතිතුමා පරිත්‍යාග කරලා එතුමා ඒක පෙන්වලා තියෙනවා. ඔබතුමන්ලත් වැටුප පරිත්‍යාග කරන්නකෝ එහෙම නම්.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ៖-** මේ ඉන්ධන දීමනාව ගන්නේ නැහැ කියපු කට්ටිය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** හැමදේම අර ගන්නවා. ඉන්ධන දීමනාවත් ගන්නවා. අනිත් හැමදේමත් ගන්නවා ගන්නේ නැහැ කිය කිය.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඕකත් බැඳගෙන බෝපෙ පෝද්දල වටේ යන්නකෝ. එතකොට හරි. ඒක ලස්සනයි. ඡායාරූපයකුත් අරගන්න. ඕක බැඳගෙන යන්න වටේටම.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එදා රුපියල් එකසිය තිස් හතට තිබුණ ඉන්ධන මිල වැඩි කරපු වෙලාවේදී ලෝක වෙළඳපොළේ බොරතෙල් බැරල් එකක මිල කොවිඩ් රෝගයත් එක්ක ඩොලර් විසි ගාණට අඩු වුණා. ඊට පස්සේ තමයි ආපහු ටිකෙන් ටික මිල ඉහල ගියේ. ඒ වෙනකොට තෙල් මිල අඩු නොකර කිවුවේ රටේ ජනතාවට අපි මේ වැඩි මිලට දෙන එකේ ලාභය මේ වෙලාවේදී එකතු කරලා මිල වැඩි වුණාම පාවිච්චි කරනවා කියලා. දැන් මොකද වෙලා තියෙන්නේ. තමන්ගේ අර්බුධය විසඳගත්තානේ. දැන් ඒ අරමුදලට වෙච්ච දෙයක් නැහැ. ඒ තෙල් අරමුදලට වගකියන්න දැන් කවුරුවත් නැහැ. එහෙම එකක් නැහැ කියලා ඇමතිවරයා දැන් කියනවා. කවුද දැන් මේවාට වගකියන්න ඕන. මේ රටේ ජනතාව ආණ්ඩු පත් කරේ ඒ ආණ්ඩු වලින් තමන්ගේ ප්‍රශ්න ටික විසඳ ගන්න. දැන් ආණ්ඩුව පත් කරන්න කලින් කිවුවේ කොහොමද, තෙල් මිල වැඩි කරන්න නම් ආණ්ඩුවක් ඕන නැහැ කිවුවා. දැන් රටේ තියෙන ප්‍රශ්නය විසඳන්න බැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමන්ලාගේ පක්ෂයේ මට්ටම ඔච්චරයි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මහ බැංකු මංකොල්ලය අල්ලන්න කතා කරා. රනිල් මහත්තයාව ඇතුළට දාන්න කතා කරලා ආවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං ඔබතුමන්ලාට හරි දුකයිනේ රනිල් මහත්තයාව ඇතුළට දානවට. මාර දුකකින් ඉන්නේ. ඒක කෙරෙන්න ඕන විදියට කෙරේවි. මන්ත්‍රීතුමා යහපාලන ආණ්ඩුව වගේ එෆ්.සී.අයි.ඩී. හදලා ඕන ඕන කෙනාව ඇතුළට දාන්නේ නැහැ. ඒකෙ වැඩ ටික පිළිවෙලකට කෙරේවි. තමන්ට ඕන කෙනාව අල්ලලා ඇතුළට දාන ක්‍රමයක් අපේ නැහැ.

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා ඃ-** දැන් ඇතුළට දාන්නේ නැහැ, එළියට දානවා ඔක්කොම ටික.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම ප්‍රශ්නයක් නැහැ අපිට. එහෙම ක්‍රමයක් නැහැ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක අපි දන්නවා. අපි අහන්නේ මේ රටේ මිනිස්සුන්ගේ අවහිරතා, අඩුපාඩු ඉවසාගෙන, ඒ ප්‍රශ්න ඉවසා ගෙන ඉඳලා කැපකිරීම් කරා. රටේ මිනිස්සු කැපකිරීම් කරා. ඒ මිනිස්සු රුපියල් එකසිය තිස් හත ගාණේ අවුරුද්දක් විතර තෙල් ගත්තා. තෙල් මිල අඩුවෙලා තියෙන කොට වැඩි මිලට ගත්තේ ඉදිරියට වාසියක් වේවි කියලා හිතලා. දැන් ඒ මිනිස්සුන්ව කබලෙන් ලිපට වැටිලා තියෙන්නේ. දැන් එක පාරක් නැවක් ගිනි අරගෙන එක විනාශයක් කරා. අපිට ඒකෙ වන්දිවත් හරියට හම්බ වුණේ නැහැ. ඉතාම සුළු වන්දියක් දුන්නේ. දැන් ඒකට මොකක්ද කරේ. මේ රටට වෙන හානිය ඔබතුමන්ලට වළක්වන්න බැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි. දැන් ඕක ගැන ඊළඟ සභාවේදී කතා කරන්නකෝ. දැන් වෙලාව පෙරවරු 10.25 යි. පැය භාගයක කාලයකට අපිට සභාව කරන්න ලබා දීලා තියෙන්නේ. ඔබතුමා පෙරවරු 10.00 ට විතර ඇවිල්ලා මේ කතා කරන්නේ. අපිට බලපාන ගොඩක් දේවල් කතා කරා. ඔබතුමා පෙරවරු 09.30 ට තියෙන සභාවට පෙරවරු 10.00 ට විතර ආවේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අපි කතා කරන කොට ඔබතුමන්ලට හරි අමාරුයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කිසි අමාරුවක් නැහැ. ඔබතුමා මොනවා කතා කරත්, ඒකෙ ඇති ගාණකුත් නැහැ. ඒක ගැන මිනිස්සුන්ට හැඟීමකුත් නැහැ. අපිට ගාණකුත් නැහැ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** තමුන්නාන්සේ හිරිවැටිලා ඉන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මුළු ලංකාවම හිරිවැටිලා. 3% ක් වත් ගන්න බැරි පක්ෂයක් මේ. එතකොට හිරි වැටිලා. අනේ මන්ත්‍රීතුමා විකාර කතා කරන්නේ නැතුව ඉන්න. ඔබතුමන්ලා කියන එක මේ මිනිස්සු පිළිගන්නේ නැහැ. මේ රජය ගැන මිනිස්සුන්ට තාම බලාපොරොත්තුවක් තියෙනවා. මේ රජය ගැන මිනිස්සු තාම බලාපොරොත්තුවෙන් ඉන්නේ. ඔබතුමන්ලා කියන විහිළු කතා නෙමෙයි, ඒක ආණ්ඩුවෙන් බේර ගනීවි. සභාවේ ප්‍රශ්න තියෙනවා නම් කතා කරන්න. ජාතික ප්‍රශ්න ආණ්ඩුව බේර ගනීවි. මේ වෙලාවේ අපි සභාව කැඳෙව්වේ මන්ත්‍රීවරුන්ට තියෙන ප්‍රශ්න කතා කරන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එන්නත්කරණය සම්බන්ධ ප්‍රශ්නයේදී ඔබතුමා මෙතන කතා කරා. මෙතන ගැටළුවක් පැන නැගුණා. මම ලේකම්තුමාටත් කතා කරලා ඒක කිවුවා. ඇත්තටම අක්‍රමවත්භාවය පිළිබඳව තදින්ම ප්‍රශ්නයක් තිබුණා. මොකද විධිමත් විදියට ප්‍රමුඛතා ලේඛනය අනුව ඒ දේ සිද්ධ වුණේ නැහැ. ඒ ප්‍රමුඛතා ලේඛන වලින් සමහර ඒවා අසාධාරණයි. මොකද ජනතාව එක්ක ගැටෙන, සේවය කරන, වැඩ කරන අයට ඒ ප්‍රමුඛතාවය දෙන්න ඕන. ඒක ඇත්ත. එතකොට සභාවේ යම් පිරිසකට

එන්නත්කරණය කරගන්න වුණේ නැහැ සම්පූර්ණයෙන්ම. ඒක ඉතාමත් වැරදි ක්‍රියාවලියක්. නමුත් ඒකට විරුද්ධව අපේ කණගාටුව සහ විරෝධය ප්‍රකාශ කරනවා. ඒ වගේම මෙතනට ලිපියක් ඉදිරිපත් කරලා තිබුණා අත්සන් කරන්න. ඒකෙ පොඩි ගැටළුවක් තිබුණා ගරු සභාපතිතුමා. ඒක ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතුමා දින දෙකක් දාලා නිශ්චිතවම තමන්ගේ පවුලේ ඥාතීන්ට සහ හිතවතුන්ට එන්නත්කරණය කරා කියලා සඳහන් කරනවා. දැන් එහෙම කරන කොට අපිට ඒක නිශ්චිතවම තියෙන්න ඕන. මෙහෙම කරා කියන එක තහවුරු කරන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් එතකොට ගෙනල්ලා ඉතුරු වෙච්ච ඒවා කොහාටද ලබා දුන්නේ. අපි දැක්කානේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ එන්නත් ලබා දෙනවා. ඒක මම පුද්ගලිකව දැකපු කාරණයක්. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයට ගෙන්වලා එන්නත් ලබා දුන්නා. එදා අපිට එන්නත් ලබා දීපු දවසේ උදෙත් එන්නත් ලබා දීලා ආවේ. එදා අපිට එන්නත් කරපු දවසේ එන්නත් හැටක් ලබා දීලා ආවේ. ඊට පස්සේ දවසේ මම ගිහිල්ලා පැය භාගයක් විතර වාහනය නවත්වාගෙන බලාගෙන හිටියා. මිනිස්සු ඇවිල්ලා එන්නත් ලබාගෙන ගියා. ඒක මම පුද්ගලිකව නිරීක්ෂණය කළා. ඒක බොහොම වගකීමෙන් මම කියනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අපි පුද්ගලයෙකුට චෝදනා එල්ල කරන කොට ඒ දේ නිශ්චිතව තියෙන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපිට ගෙනල්ලා ඉතුරු වෙච්ච එන්නත් ටිකට මොකක්ද කරේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක සම්බන්ධව විධිමත් පරීක්ෂණයක් කරන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක තමයි මේ ඉල්ලන්නේ. පරීක්ෂණයක් කරන්න කියලා කියන්න අපි මොකක් හරි තොරතුරක් ලබා දෙන්න ඕනනේ. ඒකට පරීක්ෂණයක් ඉල්ලන්න කියලා අපිට නිකං කියන්න බැහැනේ. ඒකට අපි මොකක් හරි තොරතුරක් ලබා දෙන්න ඕන. අපි ඒ තොරතුර දෙනවා. එතකොට මේ පරීක්ෂණය කරාවි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක සම්බන්ධව මට තිබුණ ගැටළුව වුණේ මේකයි. පුද්ගලයෙක්ව ඉලක්ක කරලා, ඒ පුද්ගලයා විසින් එයාගේ ඥාතීන්ට එන්නත් ලබා දුන්නා කියන එක සම්බන්ධව ගැටළුවක් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමන්ලා කොහොමත් රැවුලයි, කැඳයි දෙකම බේරගෙන යන්න හදන්නේ. ඔය ජරා ප්‍රතිපත්තිය හින්දා තමයි මන්ත්‍රීතුමා කෙලවිලා තියෙන්නේ. ඇත්ත කතාව ඒක. දැන් එහෙම නොදා කොහොමද පරීක්ෂණයක් කරන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක විධිමත්ව කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාට අත්සන් කරන්න බැරි නම්, අත්සන් කරන්න එපා.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** අපිටත් අවස්ථාවක් ලබා දෙන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒ අවස්ථාව ලබා ගන්න. මම කතා කරාට පස්සේ ඒ අවස්ථාව ලබා ගන්න.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** මෙතන හැමෝටම පොඩ්ඩක් හරි කතා කරන්න දෙන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමිය කතා කරන්න.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** ඔය කාරණයට අදාළව මේ කතා කරන්නේ. සභාපතිතුමා කියන කතාව ඇත්ත. බෝපෙ පෝද්දලට වෙන් කරපු එන්නත් වලින් විශාල කොටසකට ආපු කාරණය, ගියපු විදිය, එන්නත් කරපු ආකාරය ගැන නිසි අයුරින් තොරතුරු නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් වැලිපිටිමෝදරට ගෙනාපු එන්නත් වලින් පන්සිය ගාණක් ඉතුරුයි. බෝපෙ පෝද්දලට ලබා දීපු එන්නත් වලින් සියයකට වැඩි ප්‍රමාණයක් ඉතුරුයි. එතකොට පළිවතුගොඩට ලබා දීපු එන්නත් වලිනුත් ඉතුරුයි. දැන් එතකොට මේ ඉතුරු වෙච්ච එන්නත් කෝ.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** ඉතුරු වෙච්ච එන්නත් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට තමයි අපි පරීක්ෂණයක් කරන්න කියන්නේ.

**ගරු මන්ත්‍රිනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** ඒකට මේ වෙනකොට විධිමත් පරීක්ෂණයක් කෙරී ගෙන යනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි පරීක්ෂණයක් ඉල්ලුවට පස්සේ ඒ පරීක්ෂණය යනකොට ඕවා හොයා ගනීවි. ඒක අපි ඉල්ලුවට දෙන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මේ එන්නත් කුප්පියකින් දහ දෙනෙකුට, දොළාස් දෙනෙකුට විතර විදිනවලු. ඒ විදින ප්‍රමාණය අපි දන්නේ නැහැ. කරාපිටියේ එන්නත් දෙන වෙලාවේදී අධීක්ෂණ නිලධාරියෙක් ආවා හවස 03.00 ට විතර. ඒකෙන් කුප්පි තුනක් අරගෙන යනවා මේ අධීක්ෂණ නිලධාරියා. හවස 03.00 ට විතර ආවේ. හැබැයි මේ කාරණයේ සත්‍ය අසත්‍යතාවය නම් අපි දන්නේ නැහැ. එහා පැත්තේ රෝහලක තියලා ඒක පෞද්ගලිකව ලබා දුන්නා කියලා කියනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොහොම හරි මම මේක නිරීක්ෂණය කරා. ඊට පස්සේ දවසේ මම පැය භාගයක් විතර හිටියා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය ඉස්සරහ කැබ් එක නවත්වා ගෙන. එදා ඉරිදා දවසක්. ඉරිදා දවසේ වුණත් යනකොට සැරින් සැරේ මිනිස්සු ඇතුළට ඇවිල්ලා ගියා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** සභාපතිතුමා එතන ඉන්න වෙලාවේදී මමත් කෙනෙක්ව එතනට යැව්වා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම හිටපු පැය භාගය ඇතුළත ඉරිදා දවසක් වෙලත් මිනිස්සු ඇතුළට ඇවිල්ලා ගියා. ඒක මම නිරීක්ෂණය කරා. ඒක හිතවතුන්ට ලබා දුන්නා කියලා මම නිරීක්ෂණය කරා. ඉතිං ඒ ගැන අපි පරීක්ෂණයක් ඉල්ලනවා. ඒ පරීක්ෂණය කරන කොට ඔප්පු වේවි එහෙම එන්නත් ලබා දුන්නද, නැද්ද කියන එක. ඉතිං අපි මොකක් හරි තොරතුරක් ලබා දෙන්න ඕන. නැත්නම් කොහොමද කියන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඒ වෙලාවේ කෙනෙක් ඇවිල්ලා කතා කරාද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔව්. ඇවිල්ලා කතා කරා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඒ සිද්ධිය එතන වුණා.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා ඇතුළු සම්භාවනීය මන්ත්‍රීවරු සියළුදෙනාගෙන්ම අවසරයි. ඒ වගේම අපේ නිලධාරි මණ්ඩලයෙනුත් අවසරයි. ඇත්ත වශයෙන්ම අපේ සභාවේ හිටපු විපක්ෂ නායක හුසේන් කියාස් මන්ත්‍රීතුමාගේ වෙන්වීම ගැන පොඩ්ඩක් කතා කරන්න ඕන. ඇත්ත වශයෙන්ම එතුමාගේ ඒ පත්වීම අනුව තමයි අපි හත් දෙනෙක් එක්සත් ජාතික පක්ෂයෙන් සභාවට ඉදිරිපත් වුණේ. අදටත් අපි එක්සත් ජාතික පක්ෂය යටතේ තමයි ඉන්නේ. එතුමා මොන හේතුවක් නිසා හරි මේකට සම්බන්ධ වුණා. එතුමාගේ වෙන්වීම නිසා අපේ එක්සත් ජාතික පක්ෂය තවත් දුර්වලවීමකට ප්‍රධාන හේතුවක් වෙනවා. එම නිසා මම හිතන්නේ ඒ අරගත්තේ මෝඩ තීන්දුවක්. මේක තව මාස හයක් තියෙන්නේ නැහැ. හෙට වෙන කොට මටත් යන්න වෙන්න පුළුවන්. ඒකෙ ප්‍රශ්නයක් නැහැ. ඡන්ද පනහකින් මමත් පැරදිලා සභාවට ආවේ කියාස් මන්ත්‍රීතුමාගේ ඡන්ද ටිකක් තිබුණ නිසා. අපි හත්දෙනෙකුම ආවේ එහෙමයි. ඒකට කළගුණ සැලකීමක් කරන්න ඕන. එතුමාට ඒ කරපු අගෞරවය නිසා එක්සත් ජාතික පක්ෂය හැටියට තමන්ටම වල කපා ගැනීමක් වෙන්නේ. අපි දන්නේ නැහැ ඉදිරියට එක්සත් ජාතික පක්ෂයද, සමගි ජන බලවේගයද බිහි වෙන්නේ කියන එක. අපි ආවේ ගමට, රටට සේවයක් කරන්න පක්ෂයකින් ඉදිරිපත් වෙලා. එතුමා ආවේ ගමෙන් විශාල ඡන්ද ප්‍රමාණයක් අරගෙන. එතුමා එක්සත් ජාතික පක්ෂය යටතේ මන්ත්‍රීවරයෙක් විදියට මෙතනට ආවේ. නමුත් එතුමාට අද මෙතනින් වෙන්වීමට සිදු වුණා. ඒකට මගේ කණගාටුව ප්‍රකාශ කරනවා. එතුමාට ඉදිරියේදී මීට වැඩිය ඉහළ තනතුරක් ලබා ගෙන රටට සේවයක් කරන්න හැකි වේවා කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මම පළමුවෙන්ම හුසේන් කියාස් ගරු විපක්ෂ නායකතුමාගේ මන්ත්‍රීධූරය අහෝසි වීම පිළිබඳව බලවත් කණගාටුව ප්‍රකාශ කරනවා. මොකද, යසරත්න මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ විදියට අපි පළාත් පාලන මැතිවරණයේදී බොහොම පසුබෑමකට ලක් වෙච්ච අවස්ථාවේ තමන්ගේ කොට්ඨාශය කියාස් මන්ත්‍රීතුමා විශාල ඡන්ද ප්‍රමාණයකින් ජයග්‍රහණය කරා. ඒ ප්‍රතිශතය මත අපි හය දෙනෙකුට ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීධූර ලබා ගැනීමට අවස්ථාව ලැබුණා. ඒ කියන්නේ මුළු ඡන්ද සංඛ්‍යාව ගත්තම ඒකෙන් විශාල ඡන්ද ප්‍රතිශතයක් ලබා ගත්තේ කියාස් මන්ත්‍රීතුමා. ඒ මුස්ලිම් ජනතාව ලබා දීපු ඡන්ද වලින්. මේකට ආපු පුද්ගලයෙක් විදියට මම ඉතාම බලවත් ලෙස කණගාටුවට පත් වෙනවා එතුමාගේ මන්ත්‍රීධූරය අහෝසිවීම පිළිබඳව. ඊළගට එතුමා පහුගිය පාර්ලිමේන්තු මැතිවරණයට තරග කරා. ඒ මැතිවරණයට තරග කරපු වෙලාවේ ඒ පක්ෂයේ අක්මීමන ආසනයේ ප්‍රධාන සංවිධායකවරයාට වඩා වැඩි ඡන්ද ප්‍රතිශතයක් ලබා ගත්තා. ඇත්තටම එතුමා ජනතාව අතර ඉන්න පුද්ගලයෙක් විදියට තමයි අපි දකින්නේ. පාර්ලිමේන්තු මැතිවරණයේදී ආසන සංවිධායකවරයාට වඩා වැඩි ඡන්ද ප්‍රමාණයක් ලබා ගැනීමට

කියාස් මන්ත්‍රීතුමාට හැකි වුණේ එතුමා ජනතාව එක්ක ඉන්න නිසා. ඒ ජනතා ප්‍රසාදය එතුමාට තියෙනවා. ඒක නිසා එතුමාට මම ඉදිරි දේශපාලන කටයුතු ඉතාමත් සාර්ථකව කර ගැනීමට සුභ පතනවා. එතුමා මේ පිළිබඳව අධෛර්යමත් නොවී තවත් ශක්තිමත් වෙන්න ඕන. ඒ කියන්නේ ගහන්න ගහන්න තමයි පන්නරය ලැබෙන්නේ. ඒක නිසා මෙකෙන් ගන්න පන්නරයත් එක්ක ඉදිරි දේශපාලන වේදිකාවේදී අපිට එකට මුණ ගැසීමට හැකියාව ලැබේවා කියලා ප්‍රාර්ථනා කරමින් මම මගේ කතාව නතර කරනවා.

ඊළඟට ගරු සභාපතිතුමනි, එස්.ඕ.එස්. ළමා ගම්මානයට එහා පැත්තේ අර පෙර පාසල තිබෙන කොටස වර්ෂාව දවස් වලට සම්පූර්ණයෙන්ම යට වෙනවා. එතන අර ගමරාල කියලා පළතුරු කඩයක් තියෙනවා. ඒ පළතුරු කඩය ගාව ඉඳලා තියෙන ඒ ඇළ මාර්ගය පස් පිරිලා අවහිර වෙලා තියෙන්නේ ඒක නිසා මේ ගෙවල් වලට පවා වතුර එනවා. ඒක නිසා කරුණාකරලා ඔබතුමා ඒකට අවධානය යොමු කරලා අන්න ඒ කාණු ටික පිරිසිදු කරලා දෙන්න කියලා ඉල්ලීම් කරනවා. කීප දෙනෙක්ම මට ඒක කිව්වා. මෙතන සම්පූර්ණයෙන්ම යටවෙලා. දැන් දවස් ගාණක් යනකම් වතුර බහින්නේ නැති තත්ත්වයක් තියෙනවා. ඒක නිසා කරුණාකරලා ඔබතුමා ඒකට අවධානය යොමු කරවන්න කියලා ඉල්ලා සිටිනවා. සමස්ථ සභාවටම බොහොම ස්තුතියි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙන්න බලන්න. මේ වගේ වෛද්‍යවරු ඉන්නවා නම් මොනවා කරන්න බැරිද, වෙනුර වෛද්‍යවරයාම තමයි එන්නත ලබා දෙන්නේ. ලංකාවේ සෞඛ්‍ය සේවය මොන තැනකද තියෙන්නේ. ගෝලයෝ ඕන නැහැ. එයාම තමයි එන්නත ලබා දෙන්නේ. සජීව විජේවීර මාධ්‍යවේදියාට අපි ස්තුතිවන්ත වෙන්න ඕන. එතුමා තමයි මේක මුලින්ම රටට හෙළිදරව් කරේ. එතුමා නොවෙන්න මේක මේ විදියට එළියට එන්නේ නැහැ. ඒ පිළිබඳවත් මම මේ අවස්ථාවේදී ස්තුතිය පළ කරනවා. මේක ඇත්තටම මංකොල්ලයක්.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මට අදහසක් දක්වන්න ඕන, දීර්ඝ කාලයක් තිස්සේ බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ විපක්ෂ නායක ධූරය හොබවපු කියාස් මන්ත්‍රීතුමා ගැන. අපි දේශපාලනයේ නවකයන් හැටියට මේ ප්‍රාදේශීය සභාව නියෝජනය කරද්දිත් එතුමා ප්‍රාදේශීය සභාවේ විපක්ෂ නායකවරයා හැටියට කටයුතු කරා. ඉතිං අපි එතුමාට එම පක්ෂයෙන් ගනිපු තීන්දුව ගැන කතා කළ යුතු නැහැ. මොකද එතුමාගේ තීන්දුවේ එක පැත්තක් හරි බව අපිට දැනෙනවා. මොකද හේතුව නාම යෝජනා ගැනීම සහ පක්ෂ සාමාජිකත්වය ගන්නවා කියන දෙක අතර ඇති පරතරය නිසා පනත අනුව ඒ තීන්දුව පක්ෂය විසින් අර ගත්තා. ඒක ගැන ඒ පක්ෂය තීන්දු කරාවි. හැබැයි කෙසේ හෝ එම කොට්ඨාශය නියෝජනය කරන, මුස්ලිම් ජනතාව නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් හැටියට බොහොම සුහදශීලිව ඒ ගම් දිනා ගනිපු නායකයෙක් මේ. ඒ කොට්ඨාශයේ අපේක්ෂක මහත්මයෙක් මේ මන්ත්‍රීධූරයට පත් කරලා සභාව නියෝජනය කරා නම් මේ මුස්ලිම් ජනතාවට කරන වැරැද්ද නිවැරදි වෙනවා. ඒක මම සම්පූර්ණයෙන්ම හෙළා දකිනවා. ඒක මුස්ලිම් ජනතාවට කරපු හානියක් සහ වැරැද්දක්. ඊළඟට ගරු සභාපතිතුමනි, අපි සභාව කරන කොට එතුමාගේ දේශපාලන මතය කුමක් වුණත් බොහොම අවධානම් අවස්ථාවල අපිට නිහඬව හෝ පක්ෂව හෝ එතුමා අපිත් එක්ක සංවාද වෙලා හෝ ගන්න ඕන හොඳම තීන්දුව අරගෙන අපේ සභාවට සහයෝගය ලබා දුන්නා. මොකද යම් යම් තර්ක විතර්ක පක්ෂ දේශපාලනය කරන කොට තියෙනවා. මතභේද තියෙන කොට එතුමා සභාවේ සභාපතිවරයාට සහයෝගය ලබා දුන්නා. විශේෂයෙන්ම අයවැය යෝජනා ක්‍රියාත්මක කරන කොට අපිට සහයෝගය ලබා දීම පිළිබඳව එතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වගේම තමයි එතුමාගේ දේශපාලනය ඔතනින් නවත්වන්න බැහැ. ඔය ගන්න තීන්දු වලට. ඊටත් වඩා ජනප්‍රසාදයකින් එතුමාගේ දේශපාලන මතය හෙට දවසේදී අපි ළඟ වෙන්නත් පුළුවන් මට හිතෙන විදියට. එහෙම හරි එකතු වෙලා ශක්තිමත් දේශපාලන ගමනක් යන්න එතුමාට ශක්තිය හා ධෛර්ය ලැබෙනවා කියන එක අනිවාර්යයෙන්ම මට විශ්වාසයි. එතුමාට ජය වේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම එකක් කියන්න ඕන. ඇත්තටම අද බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා ඉතිහාසයේ ඉතාමත්ම කළු දිනයක්. මොකද කවදාවත් මම දැනුවත්ව නම් මන්ත්‍රීවරයෙක්ව පක්ෂයකින් නෙරපලා නැහැ. චෝදනා එල්ල කරලා ඩික්සන් රාජා සභාපතිතුමාව අයින් කරා. නමුත් පක්ෂයකින් පත් වෙලා ආපු මන්ත්‍රීවරයෙක්ව ඒ පක්ෂය විසින්ම මම හිතන්නේ අයින් කරපු පළවෙනි දවස තමයි මේක. ඉතාමත් අඳුරු, කළු දිනයක් අද බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවට. ඒ වගේම එතන තියෙන දෙවැනි කාරණාව තමයි, මන්ත්‍රීවරු හත් දෙනෙක් එක්සත් ජාතික පක්ෂයෙන් පත් වෙන්න මූලික හේතුව තමයි කියාස් මන්ත්‍රීතුමා වැඩි ඡන්ද දෙදහස් නවසිය ගාණකින් කුරුඳුවත්ත කොට්ඨාශය නියෝජනය කරමින් තේරී පත්වීම. ඉතිං ඒ තුළ තමයි අද මොන තත්ත්වයට බෙදිලා හිටියත්, සමගි ජන බල වේගය, එක්සත් ජාතික පක්ෂය විදියට බෙදිලා හිටියත්, කියාස් මන්ත්‍රීතුමා ලබා ගනිපු ඡන්ද ප්‍රමාණය වැදගත් වුණා. ඒ වගේම තමයි අර සඳහන් කරා වගේ ඇත්තටම ඒ මුස්ලිම් ජනතාවගේ නියෝජනය අයින් කිරීම

ප්‍රාදේශීය සභාව පැත්තෙන් කරපු ලොකු අවාසියක්. ඒක ලොකු අසාධාරණයක්. මොකද අපි එතුමත් සමඟ මොන ප්‍රශ්නය තිබුණත් වැඩ කරන්න පුළුවන් වෙලාවේදී වැඩ කරා. ඒ වගේම එතුමා අපිටත් උදවු කරන්න පුළුවන් වෙලාවට උදවු කරා පක්ෂ භේදයකින් තොරව. ඒ වගේම තමයි මම කියාස් මන්ත්‍රීතුමාට ප්‍රකාශ කරනවා, ඔබතුමා මන්ත්‍රීධූරය දරුවත්, නොදැරුවත් කුරුඳුවත්ත කොට්ඨාශයේ මුස්ලිම් ජනතාවගේ යම්කිසි ගැටළුවක් තියෙනවා නම්, ප්‍රදේශයේ පොදු අවශ්‍යතාවයක් තියෙනවා නම් ඉදිරියටත් ඔබතුමා කරුණාකරලා මාව හම්බවෙලා ඒවා ඉදිරිපත් කරන්න. ඒ ජනතාව වෙනුවෙන් වෙනත් නියෝජිතයෙක් නැහැ. ඒක මම හොඳට දන්නවා. අපි මේ මොනවා කතා කරත්, ඒ කොට්ඨාශයට නියෝජිතයෙක් නැහැ. ඉතිං ඒක තුළ ඔබතුමාගේ ඕන යෝජනාවකට සභාව තුළ මට කරන්න පුළුවන් දේ කරනවා කියලා මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න ඕන.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** ගරු සභාපතිතුමා, ඒ මතයට මමත් එකඟයි. ප්‍රදේශයේ මහජන නියෝජිතවරියක් විදියට ගිංතොට ප්‍රදේශයේ අපේ මුස්ලිම් සහෝදරවරු පිරිසක් ඉන්නවා. අපිට එයාලගේ භාෂාව තේරෙන්නේ නැහැ. අවශ්‍යතාවය තේරෙන්නෙත් නැහැ. මේ සභාවෙන් ලොකු මෙහෙවරක් සිද්ධ වුණා මුස්ලිම් ජනතාවට කියාස් මන්ත්‍රීතුමාගෙන්. ඒක ගැන එක සිතින්ම කියන්න ඕන. මේ වගේ කටයුත්තකදී මුස්ලිම් ජනතාවට අවශ්‍ය කාරණයක් තමයි මේක. මේක ජාතිවාදයක් නෙමෙයි. මුස්ලිම්, සිංහල මිනිස්සු මේ රටේ ජීවත් වෙනවා. ඒ මුස්ලිම් ජනතාව වෙනුවෙන් හඬක් නගන්නට සභාවේ හිටපු ගරු මන්ත්‍රීවරයා හැටියට ඒ ගැන කණගාටු වෙනවා. දේශපාලන වේදිකාවේදී එක්සත් ජාතික පක්ෂයෙන් නැතුව සමගි ජන බලවේගය පක්ෂයේ අපේක්ෂකයෙක් විදියට ඉදිරිපත් වීම හේතු කොට ගෙන සිදු වුණ දේ නිසා එතුමා අපෙන් වෙන් වුණා. සභාවේ සහෝදරත්වයෙන් තමයි එතුමා වෙන් වුණේ. ඇත්තටම එතුමාගේ ඉදිරි දේශපාලන ගමනට මම හදවතින්ම සුභ පතනවා. මීටත් වඩා ඉහළට එන්න, ජයග්‍රහණය කරන්න හැකි වේවා කියලා ප්‍රාර්ථනා කරනවා සහෝදර මන්ත්‍රීවරයෙක් හැටියට.

ඒ වගේම මම සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා මේ ප්‍රදේශයේ ඉන්න ප්‍රධාන පුරවැසියා විදියට. මේ රටේ ජනාධිපතිතුමා සංචරණ සීමා වලදී මිනිස්සුන්ට අත්‍යාවශ්‍ය රාජකාරි සඳහා යන්න අවස්ථාව උදාකරලා තියෙනවා. නමුත් ඒ වගේ වෙලාවකදී විවිධ ආකාරයෙන් අපි දකලා තියෙනවා නීතියට පටහැනිව මිනිස්සු සෑහෙන්න ප්‍රමාණයක් අවට සැරි සරනවා. ඒකෙදී වෙන්නේ මේ දාපු සංචරණ සීමා වල කිසිම අර්ථානුකූලභාවයක් දකින්න ලැබෙන්නේ නැති එක. මොකද මිනිස්සු හැම තැනම ඇවිදිනකොට මේ වෛරසය නිකම්ම බෝ වෙනවා. මේක තව දිගටම තිබුණත් ඇත්තටම ගරු සභාපතිතුමා තේරුමක් නැහැ. අන්න ඒක නිසා පොඩ්ඩක් ඒ ගැන විමසිලිමත් වෙලා පොලිස් ස්ථානාධිපතිතුමා සමඟ සම්බන්ධ වෙලා මේ ගැන ක්‍රියාත්මක වෙන්න.

ඒ වගේම මම ඉල්ලලා තිබුණා වක්වැල්ලේ වීදි ලාම්පු සවිකරපු හැම විදුලි කණුවකටම වගේ ස්වීච් එකක් දාන්න කියලා. මේ දවස් වල මත්ද්‍රව්‍ය ජාවාරම ටිකක් ඉහළින් කෙරීගෙන යනවා. අන්න ඒ නිසා රෑට වීදි ලාම්පු නිවනවා එක කොටසක්. අපේ වක්වැල්ල පන්සලේ පිං කැටය පවා හොරු අරගෙන ගිහිල්ලා තිබුණා. මම ඒකයි සභාපතිතුමා මේ දැනුවත් කිරීම කරේ. මොකද ඒ හිස් පිං කැටය වක්වැල්ල බන්ට් එකේ තිබිලා හම්බවුණා. ඊට පස්සේ උක්වත්ත පන්සලෙත් එහෙම දෙයක් සිදු වෙලා තිබුණා. එතකොට කරුණු කාරණා ඉදිරිපත් වුණා මේක කුසගින්නේ සිටින පුද්ගලයෙක් නෙමෙයි අරන් ගිහින් තියෙන්නේ කියන එක. මේ වෙන කොට ඒක තහවුරු වෙලා තියෙනවා. ඉතිං ගරු සභාපතිතුමනි ඒකයි මේ ඉල්ලීම කරේ.

සෞඛ්‍ය සේවය ගැන සඳහන් කරන කොට මම ඒ ටික කෙටියෙන් කියන්නම්. ඇත්තටම කියනවා නම් මේක දේශපාලන ව්‍යාපාරයකට මඩ ගැසීමක්. මොන පක්ෂයේ හිටියත් මම ඒක කියනවා. පවතින දේශපාලනයට මඩ ගැසීමක් තමයි මේ කරේ එන්නත්කරණයේදී. මොකද එතනදී හොරාට එන්නත් කරා. ඒක දිස්ත්‍රික්කය නියෝජනය කරන ඇමතිවරයාට ලොකු ප්‍රහාරයක් එල්ල කිරීමක් තමයි මේ එන්නත්කරණයේදී සිදු වුණේ. ඇත්තටම ස්තූතිවන්ත වෙනවා රමේෂ් පතිරණ ගරු ඇමතිතුමාට. එතුමා බොහොම හොඳට මේ සම්බන්ධව ක්‍රියාත්මක වුණා. අපේ ගාල්ල දිස්ත්‍රික්කයට ලැබෙන්න තිබුණ එන්නත් අවභාවිතා වීම සම්බන්ධව අපේ ජනතාව වෙනුවෙන් ලොකු මෙහෙවරක් කරන්න ඉදිරිපත් වීම සම්බන්ධව ස්තූතිවන්ත වෙනවා. ගරු සභාපතිතුමනි, ඉදිරියටත් අපි මේ කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා. රටේ තියෙන ව්‍යසන තත්ත්වයේදී ජනතාව වෙනුවෙන් අපි හැමෝම බලාපොරොත්තු වෙනවා සාමූහිකව, පක්ෂ භේදයකින් තොරව ඔබතුමාට සහයෝගය ලබා දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ස්තූතියි. පැය භාගයක කාලයක් තමයි අපිට මහා සභා රැස්වීම සඳහා ලබා දීලා තියෙන්නේ. දැන් පැයයි විනාඩි පහලොවක කාලයක් ගිහිල්ලා තියෙනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මුලින්ම සඳහන් කරන්න ඕන අපේ සහෝදර කියාස් මන්ත්‍රීතුමාගේ මන්ත්‍රීධූරය අහෝසි කරලා තිබීම සම්බන්ධව. ඒක මම සම්පූර්ණයෙන්ම හෙලා

දකිනවා. කෙටියෙන් කිවුවොත් එක්සත් ජාතික පක්ෂය මේ අවස්ථාවේදී ඒ ගනිපු තීන්දුව ඉතාම දරුණු අපරාධ තීන්දුවක්. මොකද එතුමා ඡන්ද දෙදහස් නමසිය ගාණක් අරගෙන තිබුණා. මගේ අල්ලපු කොට්ඨාශය එතුමාගේ. මේ සභාව එතුමා තුන්වරක් නියෝජනය කරමින් ප්‍රදේශයට ඉතා විශාල සේවයක් කරා. ඉතිං ඒ අනුව අපි ඒක හෙලා දකිනවා සභාව විදියට සියළුදෙනා වෙනුවෙන්ම.

ඒ වගේම ගරු සභාපතිතුමනි, එන්නත්කරණය පිළිබඳව වචනයක් කතා කරන්න ඕන. අපේ සේවක මහත්වරුන්ට සහ නිලධාරීන්ට එන්නත්කරණය නොකිරීම ඉතා විශාල අඩුපාඩුවක් විදියට මම දකිනවා. මොකද හේතුව මේ කොවිඩ් 19 ව්‍යසනය පටන් ගනිපු දවසේ ඉඳලා විෂබීජහරණය කරන්න, ඒ වගේම මිනිස්සුන්ට බඩු මලු බෙදන්න, ඒ සියලු දේ කරන්න මේ සභාව තමයි මූලිකත්වය අර ගත්තේ. නමුත් ඒක නොසලකා හැරලා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතුමන්ලා කරපු වැඩේ අපි විශාල වශයෙන් හෙලා දකිනවා. ඒ වගේම මම කියන්න ඕන වැලිපිටිමෝදර කොට්ඨාශයේ තමයි ඉස්සෙල්ලම එන්නත්කරණය පටන් ගත්තේ ගාල්ල ආසනය තුළ. එදා ඒ එන්නත්කරණය කරන කොට මම හිතන්නේ අඩුපාඩුවක් නොවී ඒ ප්‍රදේශයේ සියළු ජනතාවට අඬගහලා එන්නත් ලබා දුන්නා. ඒක සැලසුම් කරේ වෙන කවුරුවත් නෙමෙයි ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම්තුමිය. මම එතුමියට ඒකට ස්තුති කරනවා. එතුමිය ඒක හරි වෙලාවට කරා. කොටසකට උදේ 09.00 ට එන්න කිවුවා. තව කෙනෙකුට උදේ 10.00 ට එන්න කිවුවා. අන්න එහෙම වෙලාව ලබා දීලා තමයි මිනිස්සුන්ව ගෙන්වූයේ. පෝලිම නැතුව එන්නත්කරණය සිදු කරා. අවසාන වෙලාවේදී පිටින් ආපු පනහකට වැඩි පිරිසකට අපි එන්නත් ලබා දුන්නා. කිසිම වචනයක් එහෙ මෙහේ නොවී අපි ඒක කරා. අපේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතුමා යම් යම් ප්‍රශ්න දැම්මත් ගාල්ල නගරාධිපතිතුමා, අපේ සභාපතිතුමා සහ මම එකතු වෙලා ඒ කටයුත්ත ඉෂ්ඨ කරා. අපි ඒකට එතුමියට ස්තුතිවන්ත වෙනවා. ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම්තුමිය ඒ කාරණය හරියට ඉෂ්ඨ කරා කාර්ය මණ්ඩලයත් එක්ක. ඒකට මම ස්තුති කරනවා.

ඒ වගේම මම මේකත් කියන්න ඕන. දැන් මේ තෙල් මිල පිළිබඳව කතා කරනවා. ආණ්ඩුවක් ආවාට පස්සේ ඒ ආණ්ඩුව තුළ යම් යම් මිල වැඩිවීම් සිද්ධ වෙනවා. යම් යම් ආපදාවන් සිද්ධ වෙනවා. ඒ මොනවා වුණත් අපි ඒක හරි කියලා කියන්නේ නැහැ. ඒක වැරදියි කියලා කියනවා. නමුත් අපේ ගෙදරදී මට වුණත් මුදල් නැත්නම් මම ඒක කාගෙන් හරි අරගෙන තමයි මේ රටේ තියෙන තත්ත්වයට මුහුණ දෙන්න ඕන. අද ආණ්ඩුව විදියට ඒ තත්ත්වයම තමයි මේ කරන්නේ. ඒක අපි කවුරුත් තේරුම් ගන්න ඕන. ඒක අපි තේරුම් අරගෙන රටේ ජනතාව වෙනුවෙන් යම් කිසි අඩුපාඩුවක් තියෙනවා නම් ඒ අඩුපාඩුව ඉෂ්ඨ කරමින් තමයි අතිගරු ජනාධිපතිතුමත්, අගමැතිතුමත් සහ මේ රජයත් ක්‍රියාත්මක වෙන්නේ. ඉතිං ඒ අනුව අපි ඒකට වෙට්ටු දාන එක නෙමෙයි කරන්න ඕන. අපි ඒක හරි කියලා නෙමෙයි කියන්නේ. නමුත් මේ කාරණා ඉෂ්ඨ කරගෙන යන්න රජයට සහයෝගය ලබා දෙන්න ඕන කියන එක මම මේ අවස්ථාවේදී කියනවා. ඒ අනුව බැලුවම අපි එතනදී මේක හරි කියලා කියන්නේ නැහැ. ඒක වැරදියි. නමුත් කරන්න දෙයක් නැති නිසා තමයි අද මේ තත්ත්වයට පත් වෙලා තියෙන්නේ.

ඒ වගේම ගරු සභාපතිතුමනි, මට තව විනාඩියක කාලය ලබා දෙන්න. අපේ සභාව පිළිබඳ ප්‍රශ්නයක් මේක. ප්‍රියන්ත ගල්ගොඩැල්ල මහතා සහ සෝමපාල ඩයස් ගල්ගොඩැල්ල මහතාගේ පාරේ ප්‍රශ්නය ගැන අපි එදා සභාපතිතුමා එක්ක කතා කරලා ඒක බලන්න ගියා. ඒක අපිට නිහඬව බේර ගන්න පුළුවන් කාරණයක් වුණා. මමත්, අබේසේකර මන්ත්‍රීතුමත්, ලියනගේ මන්ත්‍රීතුමත්, ප්‍රියන්ත මන්ත්‍රීතුමත්, ඒ වගේම ඉන්දික මන්ත්‍රීතුමත් ඇතුළුව අපි මන්ත්‍රීවරු පස් දෙනෙක් මේක බලන්න ගියා. මේක ගැන අපි පරීක්ෂා කරා. මේ ප්‍රශ්නය පිළිබඳව මගේ කොට්ඨාශය විදියට මට ගැටළුවක් තියෙනවා. එදා කිවුවා වගේම ප්‍රියන්ත මහත්මයා පාර අඩි දහය ලබා දෙන්න, ඒකෙ තියෙන ප්‍රමාණයට ලබා දෙන්න පොරොන්දු වුණා. අපි කවුරුත් ඒකට එකඟ වුණා. ඊට පස්සේ රාජපක්ෂ මහතාත් මාව හමුවන්න ආවා. මම පැහැදිලි කරලා දුන්නා ගමේ ප්‍රශ්නයක් ඇති කරන්න නෙමෙයි කියලා මම මේක කරේ. මම මේ ප්‍රශ්නය විසඳලා දෙන්න කිවුවා හැඳුවේ. ඒක නිසා ගරු සභාපතිතුමනි, මම මේක ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. මේක කාටවත් ප්‍රශ්නයක් නොවී, සියළුදෙනාවම බේරලා මේ ප්‍රශ්නයට විසඳුමක් ලබා දෙන්න. එයාට ඒ අනවසර ඉදිකිරීම සක්‍රීය කර ගන්න ඉල්ලීමක් කරලා තියෙනවා. ඒ ප්ලෑන් එක අනුමත කරලා ඒ අවස්ථාව ලබා දෙන්න කියලා මම ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එයා එකඟද, ඒ අඟල් හය ඇතුළට ගන්න.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** එයා එකඟයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙමනම් ඒක බලමු.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඒක ගැන අපිත් එක්ක කතා කරා. ඒ නිසා මේක ගැන සභාවේදී කතා නොකරොත් ඒක අඩුපාඩුවක් වෙනවා. ඒක නිසා තමයි ඒ පිළිබඳව කතා කරේ.

**ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** ගරු සභාපතිතුමා ඇතුළු සභාවෙන් අවසරයි. අපේ කියාස් මන්ත්‍රීතුමා වෙනුවෙන් වචනයක් කතා නොකරොත් එතුමාට අගෞරවයක් කරා වෙනවා. අපි එතුමා හින්දා තමයි මේ සභාවේ වැජඹෙන්නේ. අපි ගමට සේවයක් කරේ එතුමා හින්දා. ඇත්තටම එතුමා නිසා තමයි අපිට එක්සත් ජාතික පක්ෂයෙන් මන්ත්‍රීධූරය ලැබුණේ. යම් යම් හේතූන් මත, යම් යම් දේශපාලන තීන්දු මත විවිධ මතිමතාන්තර දැරුවත් අපි සහයෝගයෙන් ගමේ වැඩ කරා. ඉතිං එතුමා ගිංතොට සියළුම ජනතාව වෙනුවෙන්, සිංහල හා මුස්ලිම් ජනතාව වෙනුවෙන් හිරබත් කාපු මන්ත්‍රීවරයෙක්. අපි ඒ ගැන එදත්, එතුමා වෙනුවෙන් පෙනී සිටියා. ඇත්තටම අපි එතුමා වෙනුවෙන් කණගාටු වෙනවා. එක්සත් ජාතික පක්ෂයෙන් මේ ගනිපු තීරණය ගැන අපි කණගාටුවට පත් වෙන්නේ නැහැ. එතුමාගේ පෞරුෂත්වය මෙහෙම බිඳ දමන්න බැහැ. අපි එතුමාව තව ඉදිරියට ගෙනියන්න, එතුමාගේ සෙවනැල්ලක් වගේ පිටිපස්සෙන් ඉන්නවා කියලා කියන්න කැමතියි. මම එතුමාට දුරකථන ඇමතුමක් ලබා දුන්නම මට කිවුවා "ටෙක්ලා මන්ත්‍රීතුමිය, මම මේ කිසි දේකට සැලෙන්නේ නැහැ, ඒක නිසා බයවෙන්න එපා, මේ මන්ත්‍රී ධූරය මට නැති වුණත් මිනිස්සු නැති වෙන්නේ නැහැ කියලා." ඒක ඇත්ත කතාවක්. අපිට මන්ත්‍රී ධූරය හෙට නැති වුණත් අපි බය වෙන්නේ නැහැ. අපිට ඉන්න ජනතාව අපි කෙරෙන් ඈත් වෙන්නේ නැහැ. අපි යම් වැඩ කොටසක් සමාජයට කරලා තියෙනවා. අපේ ගමට ගියාම බලන්න පුළුවන් අපි කරපු වැඩ කොටස. අපේ ජනතාවගේ සහයෝගය නිසා තමයි ඒවා කරේ. ඉතිං එතුමාට සහයෝගය ලබා දෙන ජනතා කොටසක් ඉන්නවා. අපි එතුමාට ශක්තිය, ධෛර්ය ප්‍රාර්ථන කරනවා ඉදිරියට යන්න හැකිවේවා කියලා. එතුමාට පාර්ලිමේන්තුව දක්වා යාමට හැකියාව ලැබේවා කියලා අපි ප්‍රාර්ථනා කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බොහොම ස්තුතියි, ජූලි 21 බදාදා නිවාඩු දිනයක් බැවින්, ජූලි 20 අඟහරුවාදා මහා සභා රැස්වීම පැවැත්වීමට යොදා ගන්නවා.

<u>**සභා රැස්වීමේ වැඩ කටයුතු අවසන් කිරීම.**</u>

මීළඟ මහා සභා රැස්වීම 2021-07-20 වන අඟහරුවාදා දින පෙ.ව 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වෙන බව දන්වා සිටිමින් මහා සභා රැස්වීම අවසන් කරන ලදී.

දිල්රුක් එන්. අබේකෝන්,
සභාපති,
බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව.